සමුළු සංවාද -01

# වර්තමාන සමාජ ආර්ථික ව්‍යුහය තුළ කෘෂිකර්මාන්තයේ දී ගොවීන් මුහුණ දෙන ගැටළු හා අභියෝගයන්

එන්.එස්.බී. ඇපාකන්ද
(පර්යේෂණ නිලධාරී)

(හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 38 වන සංවත්සරය නිමිත්තෙන් පැවැත් වූ ගොවි සම්මේලනයේ වාර්තාව)

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත, කොළඹ - 07.

# වර්තමාන සමාජ ආර්ථික ව්‍යුහය තුළ කෘෂිකර්මාන්තයේ දී ගොවින් මුහුණ දෙන ගැටළු හා අභියෝගයන්

(හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ
38 වන සංවත්සරය නිමිත්තෙන් පැවැත් වූ
ගොවි සම්මේලනයේ වාර්තාව)

MFN 11221

එන්.එස්.බී. ඇපාකන්ද
පර්යේෂණ නිලධාරී

සමුළු සංවාද: අංක 01

2010 පෙබරවාරි 24

සංවිධානය
මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ – 7

23590

23590

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු ආ
HARTI

මුද්‍රණය -2010 දෙසැම්බර්

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ 38 වැනි සංවත්සරය නිමිත්තෙන් 2010 පෙබරවාරි 24 වැනි දින ආයතනීය නාරායනසාමි සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත් වූ ගොවි සම්මේලනයේ වාර්තාව

© හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

සියළුම හිමිකම් ඇවරිණි.

පරිගණක අකුරු ඇමුණුම : ජේ. චන්ද්‍රිකා ස්වර්ණසිලි

පිටකවරය සැකසුම : සුනෙර සුචින්ත ද සොයිසා

ISSN - 2012-8711

# පෙරවදන

යැපුම් මට්ටමක පවතින කෘෂිකර්මාන්තය ආර්ථිකමය වශයෙන් ඵලදායී එකක් බවට පත්කිරීම අද ලාංකික කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ පවතින අභියෝගයක් වේ. අභියෝගය ජය ගැනීම සඳහා විවිධ වූ උපාය මාර්ගයන්, වැඩසටහන් හඳුන්වා දෙනු ලබයි. වර්තමානයේ ක්‍රියාත්මක වන "අපි වවමු - රට නගමු" ජාතික කෘෂිකාර්මික වැඩසටහන ද මෙම අරමුණ සාක්ෂාත් කරගැනීමේ අරමුණින් ක්‍රියාත්මක එකකි. මේ මගින් දේශීය කෘෂිකර්මාන්තය තුළ නාස්තිය පිටු දකිමින් මිනිස් සම්පත නිසි ලෙස භාවිතය තුළින් තිරසාර කෘෂිකර්මාන්තයක් සඳහා අවශ්‍ය පදනම සකස් කිරීම සිදුවේ.

වර්තමානයේ වෙනස්වන සමාජ හා දේශපාලන තත්ත්වයන් හමුවේ ගොවීන් මුහුණ දෙන ගැටළු හා අභියෝගයන් ද දිනෙන් දින වෙනස් වෙයි. මෙම වෙනස්වීම් හමුවේ කෘෂිකාර්මික ක්‍රමෝපායන් මෙන් ම ප්‍රතිපත්තීන් ද වෙනස් වෙමින් ඉදිරියට යාම සංවර්ධනය සඳහා පිටිවහලක් වන්නකි.

එසේ නම් ගොවීන් හා ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති සම්පාදකයන් අතර නිරන්තර සංවාදයන් ගොඩනැගීම එම වැඩසටහන් ඉදිරියට ගෙන යාමට රුකුළකි. එම අරමුණින් මෙම ආයතනය පසුගිය දශක කිහිපය තුළ දී ගොවි සම්මේලන කිහිපයක් ම පවත්වා ඇත.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ 38 වන සංවත්සරය වෙනුවෙන් වර්තමානයේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ ගොවීන් මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීම අරමුණු කරගත් සම්මේලනයක් පැවැත්විණි. මේ සඳහා ලංකාවේ විවිධ ප්‍රදේශ නියෝජනය වන පරිදි, මහා වාරි වී වගාව, සුළු වාරි වී වගාව, අතිරේක බෝග වගාව, එළවළු වගාව යන සියළු ක්ෂේත්‍ර නියෝජනය වන සේ ගොවි නියෝජිත මහතුන් තෝරා ගන්නා ලද අතර, ගොවි නියෝජිත මහතුන් 34 දෙනෙක් ඒ සඳහා සහභාගී වූහ.

මෙම වාර්තාව එම වැඩමුළුවේ දී ගොවි නායකයින් විසින් ඉදිරිපත් කරන ලද වටිනා අදහස්වලින් සමන්විත වූවකි. මෙම වාර්තාවේ අඩංගු කරුණු අදාළ ආයතනවලට වැදගත් වනවා මෙන් ම අප ආයතනයේ පර්යේෂණ හා පුහුණුකිරීමේ කටයුතුවල නියුතු නිලධාරීන්ට ද තම අනාගත වැඩසටහන් සඳහා උපකාරී වනු ඇත.

මෙම වැඩමුළුව සඳහා ගොවි නියෝජිතයින් තෝරා ගැනීමේ දී සහය දැක්වූ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා වාරි කළමනාකරණ අංශය යන ආයතනයන් හි ප්‍රධානීන්ට ස්තුතිවන්ත වෙමි.

මෙම වැඩසටහන සංවිධානය කිරීමට පුරෝගාමී වූ හිටපු අධ්‍යක්ෂ මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා මහතාටත්, ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය එල්.පී. රූපසේන මහතාටත්, වැඩසටහනේ සම්බන්ධීකාරක පර්යේෂණ නිලධාරී එන්.එස්.බී.ඇපාකන්ද මහතාටත්, සම්පත් දායකත්වය සැපයූ සියළු ම පර්යේෂණ ප්‍රජාවටත් ස්තුතිවන්ත වන අතර, විවිධ අයුරින් සහාය දැක්වූ ආයතන කාර්ය මණ්ඩලයේ කාර්යභාරය ද ඉතා අගය කරමි.

නීතිඥ ලලිත් කාන්ත ජයසේකර.
අධ්‍යක්ෂ.

# ස්තුතිය

ගොවිජන හා ග්‍රාමීය සංවර්ධන ක්ෂේත්‍රයන් හි ප්‍රතිපත්තිමය හා පර්යේෂණ සිදුකිරීම මගින් එම ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා දායකත්වය දැක්වීම අරමුණු කරගත් මෙම ආයතනය පසුගිය වසර 38 ක කාලය තුළ ඒ සඳහා දක්වා ඇත්තේ විශාල කැපකිරීමකි. ඒ පර්යේෂණ පමණක් නොව පුහුණු වැඩසටහන් ද පැවැත්වීම මගිනි.

කෘෂිකර්මාන්තය විවිධාකාර වූ අභියෝගයන් හා ගැටළුවලට මුහුණු දීමට සිදුවන්නා වූ අභියෝගකාරී ක්ෂේත්‍රයකි. සීඝ්‍රයෙන් වෙනස්වන සමාජ-ආර්ථික රටාව තුළ මෙම ගැටළු හා අභියෝගයන් ද විවිධාකාර ස්වරූපයෙන් පැන නගී. වර්තමානයේ ගොවි ප්‍රජාව මුහුණු දෙන ගැටළු හා අභියෝගයන් හඳුනා ගැනීමේ මූලික අරමුණින් ගොවි නායකයින්ගේ සහභාගිත්වයෙන් ගොවි සම්මේලනයක් ආයතනයේ 38 වන සංවත්සරයට සමගාමීව පැවැත්වුණි. 2010 පෙබරවාරි මස 24 දින පැවැත්වූ මෙම සම්මේලනය සඳහා දිවයිනේ විවිධ ප්‍රදේශ මෙන් ම විවිධ කෘෂි ක්ෂේත්‍රයන් නියෝජනය කරමින් ගොවි නායකයෝ 34 දෙනෙක් සහභාගී වූහ.

මෙම සම්මේලනය පැවැත්වීම සඳහා අවශ්‍ය ආයතනික සහයෝගය ලබාදුන් ආයතනයේ හිටපු අධ්‍යක්ෂ මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා මහතාට ප්‍රථමයෙන් ස්තුතිවන්ත වෙමි. ගොවි සම්මේලනය ඇසුරින් සකස් කළ මෙම වාර්තාව එළිදැක්වීම සඳහා අවශ්‍ය අනුග්‍රහය ලබාදුන් ආයතනයේ වර්තමාන අධක්ෂ නීතිඥ ලලිත් කාන්ත ජයසේකර මහතාට ද මාගේ ස්තුතිය පුද කරමි. එසේ ම වැඩසටහන සැකසීම සඳහා මගපෙන්වීම ලබාදුන් නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) ආචාර්ය එල්.පී.රූපසේන මහතාට ද වාර්තාව සැකසීමේ දී සහය ලබාදුන් මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශයේ අංශ ප්‍රධාන ආචාර්ය එම්.එස්.සේනානායක මහතාට ද, ස්තුතිය හිමි වේ. මෙම ගොවි සම්මේලනය සඳහා දිවයිනේ විවිධ කෘෂිකාර්මික දිස්ත්‍රික්ක මෙන් ම විවිධ ක්ෂේත්‍ර නියෝජනය වන සේ ගොවි නියෝජිතයන් සහභාගී කරගැනීමට අවශ්‍ය විය. අපගේ අවශ්‍යතාවය අනුව එම ගොවි නායකයින් තෝරාදීම පිළිබඳ ව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරි කළමනාකරණ අංශය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව යන රාජ්‍ය ආයතනයන් හි ප්‍රධානීන් හා අදාළ නිලධාරීන් වෙත ස්තුතිය හිමි වේ. එසේ ම තම වටිනා කාලය මිඩංගු කරමින් මෙම වැඩසටහනට සහභාගී වූ ගොවි නායකයින්ට ද මාගේ ස්තුතිය පිරිනමමි.

ගොවි සම්මේලනයේ දී සැසි මෙහෙයවමින් සම්පත් දායකත්වය දැක්වූ හා වැඩමුළුවේ දී අදහස් දැක්වීමෙන් දායකත්වය දැක්වූ ආයතනයේ පර්යේෂණ නිලධාරී මහතුන් වෙනුවෙන් ස්තුතිය පුද කරමි. මෙම ගොවි සම්මේලනය සංවිධානය කිරීම සඳහා විවිධ අයුරින් සහයෝගය දැක්වූ ආයතනයේ සියළු ම කාර්ය මණ්ඩලයට ද, මෙම වාර්තාවේ කළමනාකරණ සංස්කරණ කටයුතු සිදු කළ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිණී වත්සලා ගමගේ මහත්මියට ද මෙම වාර්තාව පරිගණකගත කිරීම් සිදුකළ මෙම අංශයේ කාර්යාල ලේකම් ජේ.චන්ද්‍රිකා ස්වර්ණසීලි මහත්මියට ද වාර්තාව මුද්‍රණය කර දුන් මුද්‍රණ අංශයේ ගුණරත්න මහතා ඇතුළු කාර්ය මණ්ඩලයට ද ස්තුතිය හිමිවේ.

එන්.එස්.බී.ඇපාකන්ද
පර්යේෂණ නිලධාරී / සම්මේලනයේ සම්බන්ධීකාරක
මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය

# පටුන


පිටු අංකය

පෙරවදන iii

ස්තුතිය iv

පටුන v

1. ගොවි සම්මේලනය
හැඳින්වීම 1

2. පළමුවැනි සැසිය 3
ගොවි සංවිධාන හා ගොවිජන සහභාගිත්වය, කෘෂිකාර්මික යෙදවුම්, කෘෂි ණය හා ව්‍යාප්ති සේවා

3. දෙවැනි සැසිය 8
වාරි ජල කළමනාකරණය හා කෘෂිකාර්මික අලෙවිකරණය

4. කෘෂිකාර්මික ගැටළු හා යෝජනා 12
(ගොවි සම්මේලනයේ දී කතිකාවට ලක් කළ කෘෂිකර්මාන්තයේ දී මුහුණ දෙන ගැටළු, අභියෝග හා ගොවි නායකයන් විසින් එම ගැටළු සඳහා ඉදිරිපත් කරන ලද යෝජනා

4.1 ගැටළු හා අභියෝගයන් 12
4.1.1 ගොවි සංවිධාන හා ගොවිජන සහභාගිත්වය ආශ්‍රිත ගැටළු 12
4.1.2 කෘෂිකාර්මික යෙදවුම් ආශ්‍රිත ගැටළු 13
4.1.3 කෘෂිකාර්මික ණය හා ව්‍යාප්ති සේවා ආශ්‍රිත ගැටළු 14
4.1.4 වාරි ජල කළමනාකරණය ආශ්‍රිත ගැටළු 14
4.1.5 කෘෂි අලෙවිකරණය ආශ්‍රිත ගැටළු 15

4.2 ගොවීන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා 15
4.2.1 ගොවි සංවිධාන හා ගොවිජන සහභාගිත්වය ආශ්‍රිත යෝජනා 15
4.2.2 කෘෂි යෙදවුම් ආශ්‍රිත යෝජනා 15
4.2.3 කෘෂි ණය ආශ්‍රිත යෝජනා 16
4.2.4 කෘෂි ව්‍යාප්තිය ආශ්‍රිත යෝජනා 16
4.2.5 වාරි ජල කළමනාකරණය ආශ්‍රිත යෝජනා 16
4.2.6 කෘෂි අලෙවිකරණය ආශ්‍රිත යෝජනා 17

ඇමුණුම i විශේෂ දේශනය 18
ඇමුණුම ii සහභාගි වූ ගොවි නියෝජිතවරු 20
ඇමුණුම iii සම්පත් දායකත්වය 21




පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

# ගොවි සම්මේලනය – 2010

## 1. හැඳින්වීම

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ප්‍රගමනය උදෙසා විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් රැසක් මේ වන විට ශ්‍රී ලංකාව තුළ දියත් කොට ඇති අතර, එමගින් තිරසාර කෘෂිකර්මාන්තයක් සඳහා අවශ්‍ය පියවර ගනිමින් තිබේ. මෙහි දී කෘෂි ක්ෂේත්‍රයට අදාළ සමාජ-ආර්ථික පර්යේෂණයන් හි ප්‍රතිඵල සමාජගත කරමින් එය ජාතික කෘෂි නවෝදය සඳහා ඉවහල් කරගැනීම ද සිදු වේ. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය එම කටයුත්තේ දී අනුපමේය වූ ජාතික මෙහෙවරක නියැළෙමින් සිටී. 1972 පෙබරවාරි 21 වැනි දා ස්ථාපිත කරන ලද මෙම ආයතනය සිය 38 වැනි සංවත්සරයේ දී විශේෂ අවධානයක් යොමු කළේ වෙනස්වන සමාජ-ආර්ථික හා දේශපාලන තත්ත්වයන් හමුවේ ශ්‍රී ලාංකික ගොවි ප්‍රජාවේ අවශ්‍යතාවයන්, ඔවුන් මුහුණ දෙන අභියෝග හා ගැටළු හඳුනා ගැනීමත්, ඒවාට විසඳුම් කවරේ ද යන්න විමසීමත් සඳහා යි.

මේ අනුව ශ්‍රී ලංකාව පුරා කෘෂිකාර්මික දිස්ත්‍රික්කවල වී (සුළු හා මහා වාරිමාර්ග), එළවළු හා අතිරේක බෝග වගාවන් හි නියැළි ගොවීන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය වෙත කැඳවමින් 2010 පෙබරවාරි 24 වැනි දින දවස මුළුල්ලේ ම ඔවුන් සමග සාකච්ඡා හා සංවාදයන් හි නිරතවෙමින් ඔවුන්ගේ අත්දැකීම් ඇසුරෙන් කතිකාවක් ගොඩනැංවීම සිදු කෙරිණි.

### 1.1 පිළිගැනීම හා ගොවි සම්මේලනයේ අරමුණ පැහැදිලි කිරීම

**ආචාර්ය එල්.පී.රූපසේන- නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය (හෙ.ගො.ප.පු.ආ.)**

වසර 38 කට පෙර එනම්, 1972, පෙබරවාරි 21 වැනි දින කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍ය හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමන් විසින් ගොවි ගැටළු අධ්‍යයනය සඳහා ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය මෙරටෙ හි පිහිටුවනු ලැබූ අතර, එම ආයතන පනතෙ හි ඉඩම්, ආයතන, ජල කළමනාකරණය හා අලෙවිය යන අංශයන් පිළිබඳ සඳහන් විය. විශේෂයෙන් ම කෘෂි බෝග පිළිබඳ ව විවිධ ආයතන විසින් සිදු කෙරෙන කෘෂි තාක්ෂණ පර්යේෂණ ගොවි ජනතාව කරා යාමේ දී මතුවන විවිධ සමාජීය ගැටළු මෙම ආයතනයේ පර්යේෂණ පද්ධතියට අදාළ වේ. 1980 ගණන්වල ගොවි සංවිධාන ව්‍යාපාරය ආරම්භක වකවානුවේ ඒ සඳහා වූ සියළු පුහුණුවීම් සිදු කරන ලද්දේ හෙ.ගො.ප.පු.ආයතනය මැදිහත් වීමෙනි. ඒ අනුව ආයතනයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ, ඈත පිටිසර ගොවි ගම්මාන තමන්ගේ පර්යේෂණාගාර බවට පත් කරගනිමින් අදාළ ගොවි ගැටළු සඳහා ප්‍රශ්න මාලා ආශ්‍රයෙන් තොරතුරු උකහාගෙන ඒ සඳහා වූ විසඳුම් ඉදිරිපත් කිරීම යි. මෙහි දී මෙම ආයතනය ගොවීන් හා ප්‍රතිපත්ති සම්පාදකයන් අතර අතරමැදියෙකු බවට පත් වේ. විද්‍යාත්මක ව ගොවි සමාජීය ගැටළු විසඳමින්, දෙපාර්ශ්වය අතර සංවාද ගොඩනංවමින් කෘෂි අංශයේ ප්‍රවර්ධනයට අතහිත දීම ආයතන අරමුණු ලෙස පෙන්වා දිය හැකි ය. හෙක්ටර් කොබ්බෑකඩුව ආයතනික පනතේ එක් කාරණයක් ලෙස සඳහන් වන "ගරු ඇමතිතුමා" දැනුවත් කිරීම යන්න අවධානයට ගනිමින් මෙදින සමුළුවේ දී ආයතනීය පර්යේෂණ ප්‍රජාව හා ගොවි නියෝජිතයන් විවෘත සංවාදයකට එළැඹීම සිදු විය.

### 1.2 සහභාගී වූවන්

මෙම ගොවි සම්මේලනය සඳහා ලංකාවේ විවිධ ප්‍රදේශ නියෝජනය වන සේ ද විවිධ කෘෂිකාර්මික ක්ෂේත්‍ර නියෝජනය වන සේ ද, ගොවි නායකයින් තෝරා ගැනීමට අවශ්‍ය විය. එම අරමුණ ඉටු කරගනු වස් මහා වාරිමාර්ග සහ සුළු වාරිමාර්ග යටතේ වී ගොවිතැන, අතිරේක බෝග වගාව, එළවළු වගාව යන

ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි ගොවි නියෝජිත මහතුන් 34 දෙනෙකු තෝරා ගැනිණි. ගොවි නියෝජිත මහතුන් තෝරා ගැනීම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරි කළමනාකරණ අංශය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සිදු කෙරිණි.

## 1.3 අරමුණු

**ගොවි සම්මේලනයේ ප්‍රධාන අරමුණු වූයේ,**

1. ගොවි සංවිධානයන් හි සාර්ථක හා අසාර්ථක අත්දැකීම් ඔවුනොවුන් අතර හුවමාරු කරගැනීම.

2. වර්තමාන කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ ගොවීන් මුහුණ දෙන විවිධාකාර ගැටළු හා අභියෝග ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.

3. සංවාදයේ දී මතුවන්නා වූ කරුණු පාදක කරගනිමින් පර්යේෂණ හා පුහුණු අවශ්‍යතා මතු කරගැනීම.

## 1.4. වැඩසටහනේ සංයුතිය

ඉහත අරමුණ ළඟා කරගැනීම සඳහා මෙම වැඩසටහන පහත සඳහන් පරිදි ආරම්භක දේශනය හා ප්‍රධාන සැසි 02 ක් ඔස්සේ පැවැත්විණි.

| | | | |
|---|---|---|---|
| 1. | ආරම්භක දේශනය | - | ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ වර්තමාන තත්ත්වය |
| 2. | පළමුවැනි සැසිය | - | ගොවිජන සහභාගිත්වය, කෘෂිකාර්මික යෙදවුම්, කෘෂිකාර්මික ණය හා කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය |
| 3. | දෙවැනි සැසිය | - | වාරිමාර්ග හා කෘෂිකාර්මික අලෙවිකරණය |

මෙම ප්‍රධාන සැසි දෙක ඔස්සේ ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ වන්නා වූ අභියෝග හා ගැටළු පිළිබඳ සාකච්ඡාවට ගැනුණි.

## 1.5 ආරම්භක දේශනය

වැඩසටහනට ප්‍රවේශයක් ලෙස ආරම්භක දේශනය ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) ආචාර්ය එල්.පී.රූපසේන මහතා විසින් පවත්වන ලද අතර, ඒ තුළින් ශ්‍රී ලංකාවේ ගොවි ආර්ථිකය, ප්‍රගතිය, හා වර්තමානයේ ගොවි ආර්ථිකය මුහුණ දී ඇති අභියෝග පිළිබඳ ව අවධානය යොමු කෙරිණි. මෙහි දී විශේෂයෙන් ම නිදහසින් පසු හා 1978 විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීමෙන් පසු කාලපරිච්ඡේදවල ඇතිවූ ප්‍රධාන වෙනස්කම් පිළිබඳ ව සංඛ්‍යාලේඛන ආශ්‍රයෙන් පැහැදිලි කිරීම් ඇතුළත් වුණි (සම්පූර්ණ වාර්තාව, ඇමුණුම 1).

### පළමුවැනි සැසිය

## 2. ගොවි සංවිධාන හා ගොවිජන සහභාගිත්වය, කෘෂිකාර්මික යෙදවුම්, කෘෂි ණය හා ව්‍යාප්ති සේවා

| | | | |
|---|---|---|---|
| **මෙහෙයවීම** | : ජේ.කේ.එම්.ඩී.චන්ද්‍රසිරි මහතා | - | අංශ ප්‍රධාන (කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය) |
| **සහාය** | : ශ්‍යාමිණී කුසුම් කුමාර මිය | - | සහාය අධි පර්යේෂිකා |
| | ආචාර්ය වසන්ති වික්‍රමසිංහ මිය | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිණී |
| | රේණුකා වීරක්කොඩි මිය | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිණී |
| | ආර්.එල්.එන්. ජයතිස්ස මහතා | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී |
| | එස්.එම්.ඒ. සමරකෝන් මහතා | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී |

මෙම සැසිය තුළ ඉහත කී ක්ෂේත්‍රයන්හි දී වර්තමානයේ ගොවීන් මුහුණ දෙන්නා වූ ගැටළු හා අභියෝගයන් පිළිබඳ ව සාකච්ඡාවට ගැණුනි. එහි දී වර්තමානයේ බලපැවැත්වෙන ගොවිජන සංවර්ධන පනත, වර්තමාන කෘෂිකාර්මික ප්‍රතිපත්ති, මෙන් ම විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ ගොවි ප්‍රජාව මුහුණ දෙන ගැටළු පිළිබඳ ව අදහස් ඉදිරිපත් විය.

**සාකච්ඡාවේ දී මතු වූ කරුණු**

### 2.1 ගොවීන්ගේ ආකල්ප වර්ධනය වැදගත් බව
**සිරිසේන රණවීර මහතා - සභාපති, ලුණුගම්වෙහෙර වම් ඉවුර ව්‍යාපාර උපකමිටුව**

වෙහෙරගල ජලාශය නිර්මාණය කිරීම සඳහා අදාළ ගොවි සංවිධානය විසින් ගොවීන් 8000 ක් පමණ එක්රැස් කොට ගත්තේ ගොවීන් වෙත පෙළඹවීම් සිදු කරමිනි. එනම්, ලුණුගම්වෙහෙර ජල බිංදුවකින් ගොවි ජනතාවගේ සෞඛ්‍ය, ගොවි දරුවන්ගේ අධ්‍යාපනය, සමාජීය තත්ත්වය ගොඩනැංවෙන බවට ප්‍රචාරය කරමින්, දිරි ගන්වමින් සංවිධාන ව්‍යුහය ශක්තිමත් කරමිනි. මෙහි දී නිවැරැදි නායකත්වයක් වටා ගොවි ප්‍රජාව රැස්කර ගැනිණි. ආරම්භයේ දී ජල ගැටළුව මතුවද්දී විකල්පයක් ලෙස කෙසෙල් වගාව සඳහා ඇතැම් ගොවීන් එළැඹෙන විට මත ගැටුමක් පැවතිය ද පසුව සියළු දෙනා එක ම අරමුණක් වටා ඒකරාශී වූහ. වාරි කළමනාකරණ අංශය මේ සෑම අවස්ථාවක දී ම ගොවීන් පසුපස සිටිය ද අනෙකුත් අංශවල කිසිදු සහයෝගයක් නො ලැබීම රාජ්‍ය අංශයේ විශාල දුර්වලතාවයකි. මෙහි දී රාජ්‍ය ආයතන අතර කිසිදු ඒකාබද්ධතාවයක් නො තිබුණි.

### 2.2 ගොවි සංවිධානවල බිඳ වැටීම කෙරෙහි රාජ්‍ය නිලධාරීන්ගේ බලපෑම
**සිරිසේන රණවීර මහතා - සභාපති, ලුණුගම්වෙහෙර වම් ඉවුර ව්‍යාපාර උප කමිටුව**

ලුණුගම්වෙහෙර වම් ඉවුර ගොවි සංවිධානය ශක්තිමත් වන විට රාජ්‍ය නිලධාරි තන්ත්‍රය එම බලය හීන කරන තත්ත්වයක් මෙහි දක්නට තිබිණි. ගොවි නියෝජිතයන් හම්බන්තොට දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට පවා සහභාගී වන්නේ බලහත්කාරයෙනි. එසේ ම දිස්ත්‍රික් කමිටු රැස්වීම්වල දී කාලය සීමිත යැයි පවසමින් ගොවීන්ට තම අදහස් දැක්වීමට නිලධාරීන් විසින් අවස්ථාව ලබා දෙනු නො ලැබේ. වැල්වටාරම් කියවමින් අවශ්‍ය කරුණු පැහැදිලි කිරීමට උත්සාහ කරන බව පවසමින් ගොවි නියෝජිතයින්ගේ "අඩු අධ්‍යාපනයට" අපහාස කරන තත්ත්වයක් මෙහි පවතී. උඩවලව ව්‍යාපාර ගොවි සම්මේලනයේ සභාපති එච්.කේ. කරුණාදාස මහතා ද මෙහි දී පැවසුයේ හම්බන්තොට, මොණරාගල

කමිටුවලට තම නියෝජිතයින් සහභාගී කරවා ගැනීමට නිලධාරීන් තුළ පවතින බලවත් අකමැත්ත පිළිබඳව යි. ඉහත කී පරිදි ලුණුගම්වෙහෙර සභාපති මහතා දැක්වූ තත්ත්වයට සමාන තත්ත්වයක් එම ප්‍රදේශයේ ද පවතින බව ඔහු පෙන්වා දුන්නේ ය.

### 2.3 ශක්තිමත් ගොවි සංවිධානයක්

**සරත් උපාලි මුණසිංහ මහතා - ලේකම්, මහවැලි "එච්" කලාපයේ ව්‍යාපාර කමිටුව**

මෙම ගොවි සංවිධානය විසින් දැනටමත් කලාපයේ ගොවි ප්‍රජාවට පොහොර ණය වැනි උදව් උපකාර ලබා දී තිබෙන බවත්, එම සංවිධානය මනා ලෙස සහභාගිත්ව කළමනාකරණයෙන් යුත් බවත් පැවසිණි. මෙවැනි සමුළුවකට සහභාගී වීමේ අවස්ථාව ලැබීම පිටුපස පවා ඇත්තේ ශක්තිමත් ව ඔවුන්ගේ ගොවි සංවිධානය ගොඩනැංවී තිබීම බව ද වැඩිදුරටත් සඳහන් විය.

### 2.4 ගොවි සංවිධාන නිලධාරීන් අමාරුවේ දමන රාජ්‍ය ප්‍රතිපත්ති

**දී.මු.පුංචි බණ්ඩාර මහතා - සභාපති, බුත්තල අමුණ ගොවි සංවිධානය**

යල කන්නයේ දී වැව් වතුර අඩුවීම හේතුවෙන් වී අස්වැන්න 60%කින් අඩු වී තිබිය දී වී අලෙවි මණ්ඩලය අක්කරයකින් කිලෝ 200 ක වී ඉල්ලූ හෙයින් ගොවීන් විසින් අපහසුතා මැද වී අස්වැන්න රැස් කර ගැනිණි. නමුත් ඒ අතරතුර නියෝගයක් ආවේ වී ඉල්ලුම ප්‍රතික්ෂේප කරන බව යි. මෙමගින් ගොවි සංවිධාන නිලධාරීන් දැඩි අපහසුතාවයටත්, ගොවීන් අතර හැල්ලුවටත් ලක් විණි. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාට ද මෙම ගැටළුව දන්වා යැවිණි.

### 2.5 මුදල් උපයන ගොවි සංවිධානයක්

**එච්.ඩී.අනුරුද්ධ හේරත් මහතා - අනුශාසක, "අරුණ ගොවි සංවිධානය"**

1992 දී ආරම්භ කළ තම ගොවි සංවිධානය ණය පැහැර හැරීම මත කඩා වැටුණු බවත්, නැවත ගොඩ නැංවූව ද 1996 "කඩ හත" වැව ප්‍රතිසංස්කරණයෙන් පසු නැවතත් කඩා වැටුණු බවත් සාමාජිකයින් 16 දෙනෙකුගෙන් යුතු ව පසුකාලීන ව නැවත අරඹා මේ වන විට සාමාජිකයන් 257 ක ශක්තිමත් ගොවි සංවිධානයක් බවට පත් කරගෙන ඇති බවත් පැවසිණි. " කුඹුර මෙන් ම වැව ද වේල්ල ද අපේ " යන සංකල්පනා ඇතිව ගොවීන් එක් ව කටයුතු සිදු කරමින් 258 ක පවුල් සංඛ්‍යාවකින් යුත් ගමෙ හි පවුල් 257 ක් ම සංවිධානයට බඳවා ගත හැකිවීම ජයග්‍රහණයක් බව ද පැවසේ. වර්තමානයේ ප්‍රදේශයේ ඇළවේළි නඩත්තුව ආදිය සිදු කරනු ලබන්නේ ගොවි සංවිධානය මගින් නඩත්තු වන සේවකයන් පිරිසක් අතිනි. සියළු සාමාජිකයින්ට ප්‍රතිලාභ අත්වන සේ ගොවි සංවිධානයනට කටයුතු කළ හැකි බව පෙන්විය හැකි හොඳ ම උදාහරණය මෙම ගොවි සංවිධානය යි. මෙම ගොවි සංවිධානය මගින් සංවිධානයේ ආර්ථික අභිවෘද්ධිය උදෙසා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. නමුත්, මෙම සම්මේලනයට සහභාගී වූ තවත් ගොවි සංවිධානවල නියෝජිතයන් කිහිපදෙනෙකු විසින් ම එලෙස මුදල් ඉපයීම අරමුණු කරගත් ගොවි සංවිධාන පිළිබඳ විවේචනය කෙරිණි. ගොවි සංවිධානයක් කුළී ශ්‍රමයට නොව සාමූහිකත්වයෙන් යුතුව සිය කාර්යයන් ඉටු කර ගත යුතු බවට මතයක් එහි දී දැක්විණි.

**2.6 අද / බදු ගොවි අයිතිය**
**ජේ.කේ.එම්.ඩී.චන්ද්‍රසිරි මහතා - අංශ ප්‍රධාන, කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය (හෙ.ගො.ප.පු.ආ )**

අද හා බදු ගොවින් ගොවි සංවිධානවල නීතිරීතිවලට යටත් නො වීම වර්තමානයේ වාර්තා වන ප්‍රධාන ගැටළුවකි. හෙ.ගො.ප.පු. ආයතනය පසුගිය දිනවල දී එලෙස අවිධිමත් ආකාරයට මහවැලි ප්‍රදේශවල වගා කරන්නන් පිළිබඳ පර්යේෂණයක් සිදු කරන ලදී. මෙහි දී හෙළි වූයේ, එවැනි ගොවින් ගොවි සංවිධානවලට සම්බන්ධ කරගැනීම කාලෝචිත බව යි. අද ගොවින් ගොවි සංවිධානවලට අනියම් ආකාරයට සම්බන්ධ කරගත හැකි ක්‍රමවේදයක් 2000 ගොවිජන සංවර්ධන පනතේ ම සඳහන් වේ. ඒ "ආශ්‍රිත සාමාජිකයන්" ලෙසිනි. එහි දී සම්මේලනයට සහභාගී වූ වෙනත් ගොවි නියෝජිතයන් විසින් අවධාරණය කරන ලද්දේ එකී ක්‍රමය අසාර්ථක වී ඇති අතර, එයට හේතු වී ඇත්තේ "ආශ්‍රිත සාමාජිකත්වය" තාවකාලිකව ඒ ඒ කන්නවලට පමණක් සීමා වන නිසා එවැන්නන් ගොවි සංවිධාන හමුවේ සංවේදී නො වන නිසා බව යි.

**2.7 ගොවි සංවිධාන නිලධාරීන්ගේ සමාජ ආර්ථික තත්ත්වයේ අස්ථාවර බව**
**ආර්.එල්.එන්.ජයතිස්ස මහතා - පර්යේෂණ නිලධාරී, ( හෙ.ගො.ප.පු.ආ )**

පොළොන්නරුව, අනුරාධපුරය, මච්චාගම වැනි ප්‍රදේශවල දී හෙ.ගො.ප.පු.ආයතනයේ පර්යේෂකයන් විසින් සිදුකරන ලද ක්‍රියාබද්ධ පර්යේෂණවලින් හෙළි වී ඇත්තේ ගොවින් ගොවි සංවිධාන වටා ඒකරාශි වීම අවම වීමට හේතුවක් වී ඇත්තේ සංවිධානයෙන් ගොවින්ට සිදුකරන සේවාවේ අඩුවක් නිසා බව යි. නායකත්වය සඳහා නිතරම එක ම පිරිසක් පත්වීමත්, පත්වන බොහෝ නායකයින් ද ගොවින් ම වන නිසා ඔවුන් ද තම ජීවිකාව වෙනුවෙන් කැපවන විට සංවිධානය වෙනුවෙන් කැප කළ යුතු කාලසීමාව අඩුවීමත් පිළිබඳ මෙහි දී සඳහන් විය. නමුත් රජයේ විශ්‍රාමිකයන් ගොවි සංවිධාන නායකත්වයට පත් වූ බොහෝ අවස්ථාවල ඔවුන්ගේ ඉහළ කැපවීමක් දක්නට ලැබුණු බව සඳහන් විය. සංවිධානවල නායකත්වයට පත්වූ බොහෝ ගොවින්ගේ පවුල්වල ආර්ථික හා සමාජීය මට්ටම ඉතා අස්ථාවර, පහළ මට්ටමකට පත් වී ඇති බව ද එම නිසා ම ඔවුන් කලකිරීමෙන් සිටි ආකාරය ද එම ක්‍රියාබද්ධ පර්යේෂණ සිදුකළ ගම්මානවල දැක ගන්නට ලැබුණි.

**2.8 යෝජිත ගොවිජන සංවර්ධන පනත (සංශෝධන) සම්බන්ධ සමුළුවක්**
**ආචාර්ය එල්.පී. රූපසේන - නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ), හෙ.ගො.ප.පු.ආ.**

කිසියම් සංවිධානයක් බිහිවන්නේ යම් කිසි පොදු අරමුණක්, ප්‍රතිලාභයක් අත්පත් කරගැනීමේ අපේක්ෂාවෙනි. ගොවි සංවිධානයකින් ද අත්කරගත හැකි පොදු අරමුණු රාශියකි. ගොවි නියෝජිත මහතුන් විසින් යෝජනා කරන ලද පරිදි 2000 ගොවිජන සංවර්ධන පනතෙ හි සංශෝධනයන් කිරීම් අරඹයා දීපව්‍යාප්ත ගොවි සංවිධාන කැඳවා මෙවැනි ම සමුළුවක් පැවැත්වීමට ඉදිරියේ දී යත්න දරන බව ප්‍රකාශ කෙරිණි.

**2.9 ගොවි සංවිධාන අක්‍රිය වීම**
**ඩී.එම්. ජයසිරි බණ්ඩාර මහතා - උප සභාපති, ව්‍යාපාර කමිටුව, මහවැලි බී කලාපය, දම්මින්න**

ගොවි සංවිධාන අක්‍රිය වී යාමට බලපවත්වන ප්‍රධාන හේතුවක් වී ඇත්තේ කෘෂිකාර්මික අලෙවිකරණ කටයුතු කරන අයට ද සාමාජිකත්වය ලබා ගැනීම සඳහා 2000 ගොවිජන සංවර්ධන (සංශෝධන) පනත මගින් ඉඩකඩ සලසා තිබීම යි. එසේ ම එක් එක් ආයතනවලට අවශ්‍ය ආකාරයට විවිධ ගොවි සංවිධාන පිහිටුවීමට පියවර ගැනීම තවත් කරුණකි. එබැවින් ගොවින් නො වන අය සංවිධානයේ නිලතල රැගෙන



පුස්තකාලය
LIBRARY
හෙ.ගො.ප.පු.ආ
HARTI

ඔවුන්ගේ පෞද්ගලික අවශ්‍යතා, උවමනා මත ගොවි සංවිධාන මෙහෙයවන අවස්ථා ඇත. එබැවින් ගොවීන්ට හිතකර ආකාරයට පනත සංශෝධනයට ලක් කළ යුතු වේ.

## 2.10 ගොවි සංවිධානවලට ස්වාධීන ව කටයුතු කිරීමට ඉඩදීම

**එච්.එම්.අයි.බී. හේරත් මහතා - සභාපති, ඒකාබද්ධ ගොවි සංවිධානය හුරුළුවැව**

ගොවි සංවිධානවලට ස්වාධීන ව කටයුතු කිරීමට, පනත මගින් පමණක් නොව ප්‍රායෝගිකව ද ඉඩ සලසා තිබිය යුතු ය. එහි දී රාජ්‍ය නිලධාරීන්ගේ සහාය පමණක් අවශ්‍ය වන අතර, නිලධාරීන් මැදිහත් වීම සිදු නො විය යුතු කාරණයකි. ගොවීන් අතින් සිදුවන අවැඩ සම්බන්ධව කටයුතු කිරීමේ දී ගොවි සංවිධානවලට ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරී හරහා එයට විරුද්ධව කටයුතු කිරීමට හැකියාවක් නොමැත. එසේ වන්නේ කාරක නියෝග හරිහැටි ක්‍රියාත්මක වන්නේ නැති නිසා ය.

## 2.11 ගොවිජන සංවර්ධන සභාව සමග මහවැලි ගොවීන්ගේ නියෝජිතත්වය

**පතිරාජ විජේකෝන් මහතා - ලේකම්, කොට්ඨාස කළමනාකරණ කමිටුව, ගල්කිරියාගම**

මහවැලි බල ප්‍රදේශවල සහභාගිත්ව කළමනාකරණය හොඳින් සිදුවන අතර, එය සැලසුම් කරනු ලබන්නේ ගොවි සංවිධානය විසිනි. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු, ගොවිජන සංවර්ධන සභාවට, මහවැලි නියෝජිතයන්ගේ නියෝජනය ලබා දීමට එම දෙපාර්තමේන්තු නිලධාරීන් උනන්දු වන්නේ නැත. එබැවින් ගොවිජන සේවා හා මහවැලි ආයතන ගමන් කරන්නේ දෙයාකාරයකට ය. මහවැලි ගොවි සංවිධානවල මූල්‍ය කටයුතුවලට ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරීන්ට මැදිහත් වීමට හැකියාවක්, බලයක් නොමැති නිසා මහවැලි ගොවි සංවිධාන, ගොවිජන සංවර්ධන සභාවට ඇතුළත් කරගැනීමට ඔවුන් කටයුතු නො කරයි.

## 2.12 ආයතනවල සම්බන්ධීකරණයක් නොමැති වීම

**කේ.ඒ.ප්‍රේමතිලක මහතා - සම සභාපති, සමගි ශ්‍රී පුර ගොවි සංවිධානය, පදවි ශ්‍රී පුර**

ගොවීන් වෙනුවෙන් කටයුතු කරන වාරිමාර්ග, ජල සම්පත් කෘෂිකර්ම වැනි විවිධ ආයතනවල ඒකාබද්ධතාවයක් නැත. ඔවුන් ක්‍රියාත්මක කරන වැඩසටහන්වල ඒකාබද්ධතාවයක් ද නො පවතී. ගොවීන් නො වන අයට ද ගොවි සංවිධානවල සාමාජිකත්වය ලබා ගැනීමට නීතියෙන් ඉඩ ලැබීම තුළ, ගොවි සංවිධානවල යහපත් අරමුණු ඉටු නොවේ. ගොවි සංවිධානවල නිලතල ලබා ගන්නා ඔවුන් කොන්ත්‍රාත් වැනි මුදල් සොයා ගත හැකි දේ පසු පස හඹා යාමට පටන් ගෙන ඇත.

## 2.13 ගොවිජන විනිශ්චය සභාව පත් නො කිරීම

**කේ.එච්.අනුරුද්ධ හේරත් මහතා - අනුශාසක, අරුණ ගොවි සංවිධානය මිරිහාන්පිටිය, නාගොල්ලාගම**

ගොවිජන සංවර්ධන පනත යටතේ පත්කළ යුතු ගොවිජන විනිශ්චය සභාව තවමත් පත් නො වීම බලවත් ගැටළුවකි. ගොවීන්ට කිසියම් වූ ප්‍රතිලාභයක් නො ලැබීම ගොවි සංවිධානවල සහභාගිත්වය අඩුවීමට හේතුවන බැවින් සියළු සාමාජික ගොවීන්ට කිසියම් වූ ප්‍රතිලාභ ලැබෙන සේ ගොවි සංවිධාන කටයුතු විවිධ වැඩසටහන් ඔස්සේ ක්‍රියාත්මක විය යුතු ය. ගොවි සංවිධාන අතුරු ව්‍යවස්ථාව තුළ ගොවි සංවිධානවලට විශාල වැඩ කොටසක් කළ හැකි ය. ගොවි සංවිධානවල නිරසාර භාවයට බාධාවන ප්‍රධාන කරුණු 03 කි.

1. ගොවි සංවිධානය ගමේ යම් සැලසුමක් සකස් කළත්, ඉහළින් එන සැලසුම් ම[illegible]න් මේවා යටපත් කරන අවස්ථා පැවතීම.

2. ඒකාබද්ධ ප්‍රවේශයක් නොමැතිකම, වෙනත් රාජ්‍ය ආයතනවල වැඩසටහන් ඒ අයගේ වැඩසටහන් ලෙස තනි තනිව ක්‍රියාත්මක කිරීමට යාම (සංවිධානයේ සහයෝගය ලබා නො ගැනීම).
3. ගොවි සංවිධානය ගැන හෝ ගොවි සංවිධානයක කාර්යභාරය ගැන රජයේ නිලධාරීන් අතර නිවැරදි අවබෝධයක් නොමැතිකම.

**2.14. ගොවිජන සංවර්ධන සභාවේ අසාර්ථකත්වය**
**සිරිසේන දිසානායක මහතා - උප සභාපති, ව්‍යාපාර කමිටුව, තලාව**

ගොවිජන සංවර්ධන සභාව, අසාර්ථක සංවිධානයක් බවට පත් වී ඇත. එහි ණය කමිටුවට පත්වූ නිලධාරීන් එක දිගට ම නිලතල දරමින් තම අභිමතය පරිදි කටයුතු කරයි. ණය ලබාදීමේ දී විවිධ අකටයුතුකම් සිදුකරනු ලබයි.

**2.15 රාජ්‍ය ප්‍රතිපත්ති ස්ථාවර විය යුතුයි**
**ඩී.සමරකෝන් මහතා - සභාපති, බදුල්ල දිස්ත්‍රික් ගොවි සංවිධාන බල මණ්ඩලය, ඌව පරණගම**

ගොවීන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් ගන්නා රාජ්‍ය ප්‍රතිපත්ති වරින් වර වෙනස් නොවී ස්ථිරසාර ඒවා විය යුතු ය. වරින්වර ප්‍රතිපත්ති වෙනස් වීම මත ගොවීන් අසරණභාවයට පත්වන අවස්ථා එමට යි (උදා:- අර්තාපල් ආනයනය සම්බන්ධ ප්‍රතිපත්ති නිසා). මෙවැනි ගොවි සමුළු පැවැත්වීමේ දී ගොවියා වෙනුවෙන් සෘජුව කටයුතු කරන ගොවිජන සේවා, කෘෂිකර්ම, අලෙවි යන රාජ්‍ය ආයතන නියෝජනය වන සේ නිලධාරී සහභාගිත්වය මෙන් ම අදාළ අමාත්‍යවරයාගේ සහභාගිත්වය ද අත්‍යාවශ්‍ය වන්නකි.

**2.16 ගොවීන්, ගොවි සංවිධානයේ නීතිරීති පිළිනොපැදීම**
**දී.මු.පු.ජී බණ්ඩාර මහතා, - සභාපති, බුත්තල අමුණ ගොවි සංවිධානය, බුත්තල**

අඳ ක්‍රමයට හා බදු ක්‍රමයට වගා කරන ගොවීන් ගොවි සංවිධානයේ සාමාජිකත්වය ලබා නො ගැනීමත්, සංවිධානය විසින් ගනු ලබන තීරණ, අණපනත් හා නීතිරීතිවලට යටත් වී වගා නො කිරීමත් නිතර වාර්තාවන කරුණකි. මෙය යායේ අන් ගොවීන්ගේ කටයුතුවලට සෘජුව බලපාන ගැටළුවක් වී ඇත.

## දෙවැනි සැසිය

# 3. වාරි ජල කළමනාකරණය හා කෘෂිකාර්මික අලෙවිකරණය

**මෙහෙයවීම** : ආචාර්ය ටී.ඒ.ධර්මරත්න මහතා
අංශ ප්‍රධාන (අලෙවි ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය)

**සහාය** : ආචාර්ය එල්.පී.රූපසේන මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)
චිත්‍රා හතුරුසිංහ මිය - අධි පර්යේෂිකා
එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා - පර්යේෂණ නිලධාරී

මෙම සාකච්ඡාව ප්‍රධාන වශයෙන් වාරි ජල කළමනාකරණ ක්ෂේත්‍රය ඔස්සේ මෙන් ම කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඉතා වැදගත්ම අංශයක් වූ අලෙවිකරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වර්තමානයේ දී ගොවීන් මුහුණ දෙන්නා වූ ගැටළු පිළිබඳ ව අදහස් ඉදිරිපත් කර ඇත.

**සාකච්ඡාවේ දී මතුවූ කරුණු**

**3.1 මහවැලි "එච්" කලාපයේ ජල කළමනාකරණය**
**සිරිසේන දිසානායක මහතා - උපසභාපති, ව්‍යාපාර කමිටුව, තලාව**

මෙම කලාපය අක්කර අඩි 2.5 කින් හෙක්ටයාරයක වී වගාවක් සිදු කරන කලාපයකි. මෙහි දී කලා වැවෙන් පෝෂණය වන කොට්ඨාස 05 ක් හඳුනාගෙන ජල කළමනාකරණයට පෙළඹී ඇත. ඒ අනුව යහපත් ජල කළමනාකරණයක් සිදුවන බැවින් අතිරේක බෝග වගාව සඳහා ද ජලය ඉතිරි කරගැනීමට හැකියාව ලැබී ඇති අතර, ඉන් උපරිම අස්වැන්නක් ලබා ගැනීමට හැකියාව ලැබී ඇත.

**3.2 මහවැලි "එච්" කලාපයේ ජල කළමනාකරණය**
**එම්.එම්.එම්.අනියර් මහතා - අංශ ප්‍රධාන, (පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශය) හෙ.ගො.ප.පු.ආ**

මහවැලි "එච්"කලාපයේ වාරි ජල සහභාගිත්ව කළමනාකරණය උසස් මට්ටමක පවතී. එහි මහවැලි නිලධාරීන් සහ ගොවීන් අතර පවතින සහයෝගී එකමුතුව මෙම සාර්ථක ජල කළමනාකාරිත්වයට හේතු වී ඇත.

**3.3 සහභාගිත්ව ජල කළමනාකරණය**
**පතිරාජ විජේකෝන් මහතා - ලේකම්, කොට්ඨාස කළමනාකරණ කමිටුව, ගල්කිරියාගම**

ගල්කිරියාගම කොට්ඨාස ජල කළමනාකරණ කමිටුව ද කන්න රැස්වීම්වල දී වගා සැලසුම් සකස් කොට, බෝග ජල අවශ්‍යතාවය පෙන්වා දී, ජල කළමනාකරණ කාර්යාලයට දැන්වීම සිදු කරමින් මනා ජල කළමනාකරණ කාර්යයක නියුතු වේ. මෙම කොට්ඨාසයේ ද අක්කර අඩි 2.5 කින් අක්කර 2 1/2 ක් අස්වැද්දීම සිදුකරයි. 50%ක ජලයෙන් 100%ක් වගා කරන අතර, වගා තීව්‍රතාවය 150% කි.

### 3.4 අනාගත පරපුර ගොවිතැනෙන් ඈත් කිරීම
**සිරිසේන රණවීර මහතා - සභාපති, ලුණුගම්වෙහෙර වම් ඉවුර ව්‍යාපාර කමිටුව, තිස්ස**

හම්බන්තොට ජල ගැටළුව නිසා නිරන්තරයෙන් වගා කිරීම්වල දී අර්බුධ පැන නගින දිස්ත්‍රික්කයකි. හම්බන්තොට දිස්ත්‍රික් කමිටුවේ දී ලුණුගම්වෙහෙර කලාපය සඳහා ජලය ලබා දෙන්නැයි කියමින් නිලධාරීන් හමුවේ හඩාවැළපුන ද දිස්ත්‍රික් ලේකම්වරයා පවසා ඇත්තේ, "ජලාශයට ජලය ලැබුණ හොත් ජලය ලබා දෙන්නම්" යනුවෙනි. මේ නිසා ගොවීන්ට කැකුළන් වගාවට යාමට සිදු විය. ලුණුගම්වෙහෙර ජනතාව තම දරු පරපුර කෘෂිකර්මාන්තයෙන් ඈත් කරවීමට උත්සාහ දරන්නේ මෙවැනි ගැටළු හා කළකිරීම්වලට මුළු ජීවිත කාලයේ ම තමන් මුහුණ දුන් අත්දැකීම් ඇති නිසාවෙනි.

### 3.5 ලොකු කුඩා වැව් ගොඩවීම, වැව් තාවුලු වගා කිරීම
**රෝහිතචන්ද්‍ර සෝමපාල මහතා - සභාපති, අනුරාධපුර දිස්ත්‍රික් ගොවිජන සේවා බලමණ්ඩලය, කහටගස්දිගිලිය**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවතින ලොකු කුඩා වැව් විශාල වශයෙන් ගොඩ වී අබලන් වී ඇත. වැව් තාවුලු වගා කිරීමත්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිතය නිසාවෙන් සිදුවන පස සෝදායාමත් මෙයට ප්‍රධානතම හේතුව වී ඇත. මෙම තත්ත්වය නිසා යල කන්නය පමණක් නොව මහ කන්නයේ දී වී වගාව සිදුකිරීමට පවා ප්‍රමාණවත් ජලය රැඳී සිටීමක් සිදු නො වන අවස්ථා ඇත.

### 3.6 නිත්‍යානුකූලව කටයුතු කිරීමට ගොවි සංවිධානවලට ඇති බලය
**කේ.ඒ.ප්‍රේමතිලක මහතා - සම සභාපති, සමගි, ශ්‍රී පුර ගොවි සංවිධානය පදවි ශ්‍රී පුර**

අද ගොවීන් ඇළ වේළි පිරිසිදු කිරීම නිසි නඩත්තුවකට අනුව සිදු නො කිරීම හේතුවෙන් ඇළවේළි විනාශ වී යාම හා ඒ නිසා ජලය අපතේ යාම බහුලව සිදුවුනත්, ගොවි සංවිධානයට ඒ සම්බන්ධව නිත්‍යානුකූලව කටයුතු කිරීමට බලයක් නොමැත. කාරකසභා රැස්වීම්වල ගන්නා වූ තීරණ ක්‍රියාත්මක කිරීමට යාමේ දී ගොවි සංවිධාන නිලධාරීන්ට විවිධ ගැටළුවලට මුහුණ දීමට සිදුවේ. මෙහි දී නීතිමය පැත්තෙන් ගොවි සංවිධානය අසරණ වන අවස්ථා පවතී. කන්න තීරණයක් නීතියට අනුව ක්‍රියාත්මක කිරීමට ගොවි සංවිධානයට හැකියාවක් නොමැත. එයට හේතුව වන්නේ දැනට වගා කටයුතු කරන්නේ අද ගොවීන් වීම යි. එකී අද ගොවීන් මෙම ජනපදවල 3 වන පරම්පරාවට අයත් ගොවි පවුල්වල සාමාජිකයන් ය. මේ සඳහා යෝජනා කළ හැක්කේ ඔවුන් සඳහා ගොවි සංවිධාන සාමාජිකත්වය (තාවකාලිකව) ලබාදීම යි. නමුත් ඔවුන්ට ඉඩම් අයිතිය නොමැති නිසා සාමාජිකත්වය හා ප්‍රතිලාභ පිළිබඳ ගැටළු පැන නගී.

### 3.7 ජල කළමනාකරණය සම්බන්ධ ගැටළු
**පී.ජී. කරුණාරත්න මහතා - සභාපති, මොරගහකන්ද ගොවි සංවිධානය**

ඉතා දිග කාලයකින් වාරිමාර්ග ක්‍රම ප්‍රතිසංස්කරණයට භාජනය නො කිරීම ජලය බෙදා හැරීමේ ගැටළු ඇතිවීමට ප්‍රධාන හේතුවක් බවට පත් වී ඇත. මේ නිසා අවශ්‍ය වේලාවට, අවශ්‍ය පරිදි ජලය ලබා ගැනීමේ ගැටළු මතු වී ඇත.

### 3.8 වැව් ප්‍රතිසංස්කරණය නො කිරීම

**ඩී.එම්.සී. කපිල ප්‍රියන්ත මහතා - සභාපති, ඇතිලිවැව දකුණු ඇළ ගොවි සංවිධානය, ඇතිලිවැව, මොණරාගල**

අහස් දියෙන් පෝෂණය වන, මෙම දිස්ත්‍රික්කයේ ඇති කුඩා වැව් රාශියක් රොන්මඩින් පිරියාම නිසා වැසි සමයේ දී වැව්වල අල්ලන ජල ධාරිතාව ක්‍රමයෙන් අඩු වී ඇත. බොහෝ කාලයකින් මෙම වැව් නිසි ලෙස ප්‍රතිසංස්කරණය කර නැත (ජලධාරිතාව වැඩිවන සේ). සාමාන්‍ය වර්ෂාවකටත් වැව වාන් දමන අතර, සති 02 – 03 කින් සිඳී යයි.

### 3.9 කෘෂිකාර්මික උපදෙස් නිසි පරිදි නො ලැබීම

**නිහාල් වන්නිආරච්චි මහතා - රුහුණු ගොවි සංවිධානය, රාජාංගනය**

කෘෂිකාර්මික උපදෙස් ලැබීම ඉතාමත් අඩු ය. කෘෂි රසායන ආදිය පිළිබඳ උපදෙස් ලබා ගැනීමට සිදුවී ඇත්තේ මුදලාලිලාගෙනි. කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන්ගෙන් එම සේවය නො ලැබේ. කෘෂි උපදේශකවරුන් ක්ෂේත්‍රයට නිතර එන්නේ නැත. ඔවුන් ක්ෂේත්‍ර පරීක්ෂණවලට එන්නේ නැත. කෘ.ප.නි සහකාරවරුන්ට ක්ෂේත්‍ර පුහුණුවක් දී ඇත්ද යන්න සැකයකි. ගොවින් සඳහා කෘෂිකර්ම පුහුණු වැඩසටහන් ලබාදීම ඉතා වැදගත් නමුත් එය එසේ සිදු නොවේ.

### 3.10 කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේ පවතින දුර්වලතා

**සිරිසේන ජයවීර මහතා - සභාපති, ලුණුගම්වෙහෙර වම් ඉවුර උප කමිටුව, තිස්ස**

පසුගිය කාලයේ සිටි කෘෂි ව්‍යාප්ති නිලධාරීන් හා වගා නිලධාරීන් ද ග්‍රාම නිලධාරී තනතුරට පත් කිරීම කෘෂිකර්මාන්තයේ ව්‍යාප්ති සේවයට වැදුණු ලොකු පහරකි. කෘෂිකාර්මික පර්යේෂණ සොයා ගැනීම් ගමට යන විධිමත් ක්‍රමයක් දැනට නැත. ඒ පිළිබඳ ව රාජ්‍ය නිලධාරීන් දැනුවත් කළත් ඔවුන් හරහා එය ගමට යන්නේ නැත. ව්‍යාප්ති සේවයේ ඇති අඩුපාඩු විසඳීමට විධිමත් වැඩපිළිවෙළක් තවමත් ගෙන නැත. ප්‍රදේශයට අනුයුක්ත කෘෂි උපදේශකවරුන් ප්‍රදේශය තුළ ආදර්ශ ගොවිපොළ කිහිපයක් ඇති කරන්නේ නම් එය ව්‍යාප්ති සේවයට රුකුළකි.

### 3.11 කෘෂිකාර්මික යෙදවුම්

**කේ.එම්.අයි.බී.හේරත් මහතා - සභාපති, ඒකාබද්ධ ගොවි සංවිධානය , හුරුළුවැව, දඹුල්ල**

වර්තමානයේ කෘෂිකාර්මික යෙදවුම් (උපකරණ,රසායන) සඳහා පෞද්ගලික අංශය මතම යැපීමට ගොවින්ට සිදු වී ඇත. ඉන් ගොවියා ගසා කෑමට ලක්වේ. එබැවින් මෙම වෙළෙඳ අධිකාරිය නැති කිරීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන මීට වඩා දායකත්වයක් ලබාදිය යුතු යි. කාබනික පොහොර භාවිතය වැඩි කිරීම සඳහා පුළුල් වූ වැඩපිළිවෙළක් දියත් කළ යුතු අතර, මේ සඳහා ගොවින් පෙළඹවීමට මීට වඩා විධිමත් වැඩපිළිවෙළක් සැකසිය යුතු යි. ඒ සඳහා සහනාධාර යටතේ රසායනික පොහොර නිකුත් කිරීමේ දී කාබනික පොහොර යොදන්නේදැ යි විමසා සහතිකයක් නිකුත් කිරීමට පියවර ගැනීම වඩා වැදගත් ය. උසස් බිත්තර වී භාවිතයේ දී 100% ක් කාබනික පොහොර පමණක් යෙදීම ප්‍රායෝගික නොවේ. ඒ සඳහා රසායනික පොහොර යෙදීම ද අත්‍යාවශ්‍ය වේ.

### 3.12 බැංකු ණය සඳහා පොළිය අධික බව

**සිරිසේන දිසානායක මහතා - උප සභාපති, ව්‍යාපාර කමිටුව, තලාව**

දැනට කෘෂිකාර්මික උපකරණ මිලදී ගැනීමේ දී බැංකුවලින් ලබා ගන්නා ණය සඳහා අයකරන පොළී මුදල අධික ය. එය ගොවියාට බරකි. ගොවිජන සංවර්ධන සභාවට පත්වන නිලධාරීන් හා එහි ණය කමිටුවට පත්වන නිලධාරීන් එක දිගට ම එම තනතුරුවල රැඳී සිටීම විශාල ගැටළුවකි. එහි දී එම නිලධාරීන්ට අවශ්‍ය හිතවත් අයට පමණක් ණය පහසුකම් ලබාදේ.

### 3.13 ගොවි ණය ලබා ගැනීමේ දී අපහසුතා

**පතිරාජ විජේකෝන් මහතා - ලේකම්, කොට්ඨාස කළමනාකරණ කමිටුව, ගල්කිරියාගම**

ගොවීන්ගේ අවශ්‍යතා ඉටු කිරීමට බිහිවූ මහජන/ලංකා බැංකු අද ව්‍යාපාරික බැංකු බවට පත් වී ඇත. ගොවිජන බැංකු ක්‍රමය තුළ ද අක්‍රමිකතා පවතී. අද එය නිලධාරීන්ට අවශ්‍ය ආකාරයට කටයුතු කරගෙන ය යි. මෑතක දී ආරම්භ කර ඇති ලංකා පුත්‍ර බැංකුව ද ගොවීන්ගෙන් තැන්පතු ලබාගෙන ව්‍යාපාරිකයින්ගේ අවශ්‍යතා ඉටුකර දෙන ආයතනයක් බවට පත් වී ඇත. ගොවීන්ට ණය දෙන විට විවිධ කොන්දේසි පනවයි. ගොවි සංවිධාන බිඳ වැටීමට මෙය ද එක් හේතුවක් වී ඇත.

### 3.14 කෘෂිකාර්මික ණය

**ජයසිරි බණ්ඩාර මහතා - උප සභාපති, ව්‍යාපාර කමිටුව, මහවැලි "බී" කලාපය, දම්මින්න**

වගා පාලුවල දී රක්ෂණ මුදල් ලැබීම ප්‍රමාද වේ. එය කන්නය තුළ ම ලැබිය යුතු යි. ගොවි ණය ලබාදීමේ දී වර්තමානයේ අය කරන පොළිය අධික බැවින් ගොවියාට එය දැරිය නො හැක. යම් කිසි විදියකින් එක් කන්නයක් තුළ ණය ගෙවීමට බැරි වුව හොත් ඊළඟ කන්නයේ 21% දක්වා වූ ඉහළ පොළියක් අයකර ගනී. එය වැළැක්විය යුතු ය. එබැවින් ගොවීන්ට හිතකර ණය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ යුතු යි.

### 3.15 කාබනික පොහොර නිෂ්පාදනයේ දී මතුවන ගැටළු

**ඩී.පී.එම්. පුංචි බණ්ඩා මයා - රුවන්වැලි ගොවි සංවිධානය, අනුරාධපුරය**

ස්වයං රැකියාවක් ලෙස කාබනික පොහොර නිෂ්පාදනය කළ ද අලෙවි කිරීමේ ක්‍රමවත් වැඩපිළිවෙළක් නොමැත. මේ සඳහා යම් රාජ්‍ය අනුග්‍රහයක් ලබාදිය යුතු යි. අක්‍රමවත් පළිබෝධනාශක අද රජරට ප්‍රදේශයේ විශාල ගැටළුවකි. පළිබෝධනාශක හා වල්නාශක ක්‍රමවත්ව භාවිතය පිළිබඳ ව ගොවීන්ට නිසි අවබෝධයක් ලබාදීමේ වැඩපිළිවෙළක් සැකසිය යුතු ය. වර්තමානයේ පවතින ව්‍යාප්ති සේවය තුළින් එය එසේ සිදු නොවේ.

## කෘෂිකාර්මික ගැටළු හා යෝජනා

# 4. ගොවි සම්මේලනයේ දී කතිකාවට ලක් කළ කෘෂිකර්මාන්තයේ දී මුහුණ දෙන ගැටළු, අභියෝගයන් හා ගොවිනායකයන් විසින් එම ගැටළු සඳහා ඉදිරිපත් කරන ලද යෝජනා

## 4.1 ගැටළු හා අභියෝගයන්

### 4.1.1 ගොවි සංවිධාන හා ගොවිජන සහභාගීත්වය ආශ්‍රිත ගැටළු

- 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත අනුව, ගොවි සංවිධානයක සාමාජිකත්වය ලබා ගැනීම පිණිස කෘෂිකාර්මික අලෙවි කටයුතුවල නියැළී අයට ද හැකියාව ලැබී තිබීම හා ඒ මගින් ගොවි සංවිධාන විනාශ වී යාමට මග පෑදී තිබේ. එහි දී සංවිධානවල නිලතල ලබා ගන්නා එම පිරිස ගොවි අවශ්‍යතා මත නොව, තම අවශ්‍යතා ආදියට මුල් තැන දී කටයුතු කිරීම දක්නට ලැබේ. ප්‍රාදේශීය සභා නියෝජිතවරු, හා රජයේ නිලධාරීන් ඔවුන්ගේ ග්‍රහණයට හසුවන අවස්ථා ඇත. ගොවි සංවිධානවල නිලතල ලබා ගන්නා අය ගොවීන්ගේ අවශ්‍යතාවයන් කෙරෙහි කටයුතු කරනවාට වඩා දේශපාලන සම්බන්ධකම් මත කොන්ත්‍රාත් ලබා ගැනීම වැනි තමනට වාසිදායක දේ කිරීමට පෙළඹී සිටීම.
- ගොවිජන සංවර්ධන පනත අනුව කාරක නියෝග ක්‍රියාත්මක කිරීම අපහසු වී ඇත. එබැවින් ඒ ඒ නිලධාරීන්ට අවශ්‍ය පරිදි කටයුතු කිරීමට ඉඩ ලැබීම.
- 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතෙ හි එන ආයතනික සංවර්ධන අංශය සමග ගොවීන් නිරන්තර ගැටුම් ඇති කරගැනීම හා ආයතනික සංවර්ධන අංශයේ මැදිහත් වීම දුර්වල වීම.
- ගොවිජන සංවර්ධන සභාව අසාර්ථක සංවිධානයක් බවට පත් වී තිබීම. එහි ක්‍රියාත්මක ණය කමිටුව එකම කණ්ඩායමක් විසින් දීර්ඝකාලීන ව පවත්වාගෙන යන අතර, ඉන් එකම කණ්ඩායමක් වෙත පමණක් ණය පහසුකම් ලබා දීම.
- ගොවියා පිළිගන්නා තත්ත්වයක් තවමත් රට තුළ ගොඩ නැගී නොමැති වීම. නවීන ජනමාධ්‍යයන්ගෙන් ද ගොවීන් හා ගොවිතැන අරභයා සකස් කරන වැඩසටහන් අවම මට්ටමක තිබීම.
- කන්න රැස්වීම්වල දී ගනු ලබන තීරණවලට එරෙහිව යන ගොවීන් සඳහා ක්‍රියාත්මක වීමට නෛතික බලයක් ගොවි සංවිධාන නිලධාරීන්ට හිමි වුව ද ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ දී ගැටළු ඇතිවීම.
- ගොවිජන සංවර්ධන පනත පරිදි ගොවිජන සේවා විනිශ්චය සභාව පත් නොකර සිටීම නිසා වැරදිකරුවන්ට එරෙහි ක්‍රියා මාර්ගයක් ගැනීමේ දී ගොවි සංවිධාන නිලධාරීන් අපහසුතාවලට පත්වීම.
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ද ගොවි සංවිධානවල මූල්‍ය තත්ත්වය, විගණන තත්ත්වය හා නීත්‍යානුකූල තත්ත්වයන් පිළිබඳ සොයා බලනවා විනා ඒවායේ කෘෂිකාර්මික හා වෙනත් වැඩපිළිවෙළ සොයා නො බැලීම.
- ගොවි සංවිධානවලින් බහුතර සාමාජිකයන්ගේ අවශ්‍යතාවයන් ඉටු නො වන නිසා සාමාජිකයන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය නො ලැබී යාම හා ඒ සඳහා ගොවි සංවිධානවල නායකත්වයේ ඇති දුර්වලතා බලපෑම.
- අර්ධකාලීන ගොවීන් හා ඉඩම් වැඩි ප්‍රමාණයක් හිමි ගොවීන් ගොවි සංවිධාන කටයුතුවලට සහභාගී නො වීම.
- කුඹුරු ඉඩම් අඳයට වැඩකරන්නන් හා බද්දට වැඩකරන්නන් කාලීන වගාකරුවන් වන බැවින් ඔවුන් ගොවි සංවිධානයේ කටයුතුවලට සහභාගී නො වීම හා සංවිධානයේ නීතිරීතිවලට අවනත නො වීම.

- ➢ කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා විවිධ ආයතන මගින් විවිධ වැඩසටහන් දියත් කළ ද එම ආයතන අතර හෝ එම වැඩසටහන් අතර සම්බන්ධතාවයක් නොමැති වීම නිසා ගොවීන්ට එම සේවාවන් අහිමි වී යාම.
- ➢ ගොවි සංවිධාන සාමාජිකයින් හුදෙක් ම පොහොර සහනාධාරය ලබා ගැනීමට පමණක් ගොවි සංවිධාන සමග එකතු වීමෙන් සභාපති ඇතුළු නිලධාරීන් නිරන්තර අපහසුතාවයන්ට පත්වීම හා අනෙකුත් වැඩසටහන් සඳහා සාමාජිකයන්ගේ සහභාගිත්වය අඩුවීම.
- ➢ විවිධ අකටයුතුකම් සම්බන්ධව (උදා:- පරිසර හානි) ගොවි සංවිධාන නිලධාරීන්ට පොලිසි, උසාවි යාමට සිදුවීමේ දී වගකිවයුතු රාජ්‍ය නිලධාරීන් ඉන් නිදහස් වන අතර, ගොවි සංවිධාන නිලධාරීන් පමණක් තනිවන අවස්ථා ඇත. එහි දී ගොවි සංවිධාන නිලධාරීන් හා ගොවීන් අතර අමනාපකම් ඇතිවේ. එය සංවිධානයේ පැවැත්මට බාධාවන් ඇතිවන කාරණයක් වීම.
- ➢ ගොවි සංවිධාන ව්‍යාපාර කමිටුව (මහා වාරිමාර්ග) සඳහා ප්‍රදේශයේ පොලිසිය සහභාගී විය යුතු වුව ද සහභාගී නො වීමෙන් නිලධාරීන් හා පොලිසිය අතර දුරස්ථභාවයක් ඇතිවීම.
- ➢ ප්‍රාදේශීය සභා, ප්‍රාදේශීය ලේකම්, ගොවිජන සේවා, සමුපකාර වැනි ආයතන නියෝජනය නිසි පරිදි ව්‍යාපාර කමිටුවට නො ලැබීම හා දිසාපති හා ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහභාගිත්වය පනතේ ම සඳහන් වුව ද ඔවුන් ඊට සහභාගී නො වීම හේතුවෙන් ගැටළු මතුවීම.
- ➢ ගොවි සංවිධානවලට ස්වාධීනව කටයුතු කිරීමට පනතින් ඉඩකඩ පවරා ඇතත්, ප්‍රායෝගික ව ඒ සඳහා අවස්ථා අහිමිවී යාම සහ රජයේ නිලධාරීන්ගේ අනවශ්‍ය මැදිහත්වීම.
- ➢ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු යටතේ පවතින ගොවිජන සංවර්ධන සභාව, සඳහා මහා වාරිමාර්ග හා මහවැලි ගොවි සංවිධාන නියෝජිතත්වය ලබා නො ගැනීම (මෙම ගොවි සංවිධානවල මූල්‍ය කටයුතු සඳහා ගොවිජන සංවර්ධන නිලධාරීන්ගේ මැදිහත් වීම කළ නො හැකි නිසා එසේ වන බව පවසයි ).
- ➢ පක්ෂ දේශපාලනය, පෞද්ගලිකත්වය, ඥාතිත්වය හරහා කල්ලිවාදය, ඉස්මතුවීම මගින් ගොවීන්ගේ සහභාගිත්වය දුර්වල වීම.

### 4.1.2 කෘෂිකාර්මික යෙදවුම් ආශ්‍රිත ගැටළු

- ➢ කෘෂිකාර්මික යෙදවුම් සඳහා පෞද්ගලික අංශය මත යැපීමට සිදුවීම නිසා අධික මිලක් ගෙවීමට සිදුවීම.
- ➢ පෞද්ගලික සමාගම්වලින් ලබාදෙන බීජවල ප්‍රමිතිය සම්බන්ධ ගැටළු මතුවීම. කෘෂි රසායන හා රසායනික පොහොර නිසා දේශීය බීජ විනාශ වී යාම.
- ➢ වී ගොවිතැන සඳහා උසස් බිත්තර වී භාවිතයේ දී කාබනික පොහොර පමණක් යෙදීමට හැකියාවක් නොමැත. ඒ සඳහා රසායනික පොහොර, කෘෂි රසායන ආදිය ද අවශ්‍ය වන බැවින් 100% ක් කාබනික පොහොර වගාවට යෙදවීමට නො හැකි වීම.
- ➢ කාබනික පොහොර ප්‍රචලිත කිරීමේ වැඩසටහන්වල දී පිදුරු යෙදීමට ගොවීන් අකමැත්තක් දැක්වීම (කුඹුරු, වගුරු බිම් බවට පත්වන නිසා රෝද 04 ට්‍රැක්ටර් ආදිය කුඹුරු වලට යෙදීමට නො හැකිවීම).
- ➢ ස්වයං රැකියාවක් ලෙස කාබනික පොහොර නිෂ්පාදනය කළ ද අලෙවි කිරීම අපහසු වීම (අනුරාධපුර දිස්ත්‍රික්කය). එමෙන් ම ඒ සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් රාජ්‍ය අනුග්‍රහයෙන් යොදා නොමැති වීම. කාබනික පොහොර භාවිතයේ ප්‍රතිලාභ පිළිබඳ ව ගොවීන් හොඳින් නො දැන සිටීම හා ඒ පිළිබඳ කටයුතු කරන රාජ්‍ය ආයතන නිලධාරීන් මගින් ඒ පිළිබඳ නිසි දැනුමක් ගොවීන්ට නො ලැබීම.
- ➢ පළිබෝධ නාශක හා කෘමි නාශක ක්‍රමවත් භාවිතය පිළිබඳ ගොවීන්ට නිසි අවබෝධයක් නොමැතිවීම හා ඒ පිළිබඳ ව ව්‍යාප්ති සේවය මගින් සැකසූ ක්‍රමවත් වැඩපිළිවෙළක් නැතිකම.

235990


පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ.
HARTI

- බෝග වගාවට කාබනික පොහොර හා රසායනික පොහොර යෙදීමේ දී යොදන සංයුතිය පිළිබඳ නිසි අවබෝධයක් නොමැති වීම.

### 4.1.3 කාෂිකාර්මික ණය හා ව්‍යාප්ති සේවා ආශ්‍රිත ගැටළු

- රාජ්‍ය බැංකුවලින් කෘෂි ණය ලබාදීමේ දී අනවශ්‍ය බාධා/විවිධාකාර කොන්දේසි පැවතීම.
- ගොවිජන සංවර්ධන බැංකු මගින් ණය නිකුත් කිරීමේ දී ගොවිජන සංවර්ධන නිලධාරීන් හිතුමතයට තම හිතවතුන්ට ණය දීමට පෙළඹීම.
- පළිබෝධ නාශකවල මිල ඉහළ බැවින්, ලබා ගන්නා ණයවලින් වැඩි ප්‍රතිශතයක් පෞද්ගලික සමාගම් වෙත ආපසු ගලා යාම.
- කෘෂි උපකරණ මිලට ගැනීම සඳහා බැංකුවලින් ලබා ගන්නා ණය මත අයකරන පොළිය අධික වීම.
- ගොවිජන බැංකුව, ලංකා පුත්‍ර බැංකුව වැනි ගොවීන් සඳහා ම පිහිටවූ ආයතන ද ඒවායේ නිලධාරීන්ට අවශ්‍ය ආකාරයට කටයුතු කරගෙන යාම.
- ලංකා බැංකුව, මහජන බැංකුව, සණස සංවර්ධන බැංකුව, වැනි රාජ්‍ය ආයතන ගොවීන්ගෙන් තැන්පතු ලබාගන්නත් ණය ලබාදීමේ දී ව්‍යාපාරිකයින් සඳහා වැඩි ප්‍රමුඛතාවක් ලබාදීම.
- කුඹුරු හානිවලදී ක්ෂණික ව වන්දි මුදල් නො ලැබීම (රක්ෂණ වන්දි ගෙවීමේ දී සිදුවන ප්‍රමාදයන්).
- කාෂිකාර්මික නිලධාරීන් ක්ෂේත්‍රයට නො පැමිණීම නිසා ව්‍යාප්ති සේවාවන් ප්‍රමාණවත්ව නො ලැබී යාම.
- කෘෂි ව්‍යාප්ති සේවාව සඳහා ප්‍රමාණවත් පරිදි නිලධාරීන් නො සිටීම.
- කාෂිකර්ම පර්යේෂණ නිලධාරීන්ගේ දැනුවත්භාවය ප්‍රමාණවත් නො වීම (ව්‍යාප්ති සේවය පිළිබඳ දැනුම).
- රජයේ කාෂිකාර්මික පර්යේෂණවල ප්‍රතිඵල ගොවීන් වෙතට ගලා යන ක්‍රමවේදයක් නොමැති වීම.
- කෘෂි පුහුණුව සඳහා විදෙස්ගත වන නිලධාරීන් ලබා ගන්නා දැනුම ගොවීන් වෙත ගලා නො ඒම. එබැවින් ගොවීන් පැරණි සාම්ප්‍රදායික ක්‍රමවල ම යෙදී සිටීම.

### 4.1.4 වාරි ජල කළමනාකරණය ආශ්‍රිත ගැටළු

- අනවසර ලෙස වැව් තාවුලු මෙන් ම වැව් රක්ෂිතය බෝග වගාවට යොදාගෙන තිබීමෙන් වැව් ගොඩ වීම.
- අනිසි ලෙස කෘෂි රසායන (වල් නාශක) හා රසායනික පොහොර භාවිතය හේතුවෙන් පස සෝදා යාමෙන් වැව් ගොඩ වීම.
- අහස් දියෙන් පෝෂිත කුඩා ප්‍රමාණයේ වැව් රොන්මඩවලින් ගොඩ වී තිබීම නිසා එහි රඳන ජලය එක් කන්නයකටවත් ප්‍රමාණවත් නො වීම.
- අඳ ගොවීන් /බදු ගොවීන් ඇළවේළි පිරිසිදු කිරීමේ කාර්යය සඳහා දායකත්වය නො දීම හා ඒ හේතුවෙන් නිසි ජල කළමනාකරණයක් කළ නො හැකි වීම (ඔවුන් කන්න රැස්වීම්වල තීරණ පිළි නො පැදීම).
- කෙත් ඇළ පිරිසිදු නො කර සිටින්නන්ට එරෙහිව දඩ ගැසීමට බලයක් ගොවි සංවිධානවලට නොමැති වීම.
- දීර්ඝ කාලයකින් වාරිමාර්ග ප්‍රතිසංස්කරණ සිදු නො කිරීමෙන් ජලය බෙදා ගැනීමේ ගැටළු මතු වී තිබීම.
- එල්.ටී.ටී.ඊ ක්‍රියාකාරකම් හා සත්ව හානි නිසා හානියට පත්ව ඇති වැව් අමුණු තවමත් පිළිසකර කර නො තිබීම (වැලිඔය).
- ඔයවල අනවසර වැලි ගොඩදැමීම නිසා භූගත ජල මට්ටම පහළ යාම.
- වැව්වල සීමා මායිම් නො තිබීම නිසා ගොවි සංවිධානවලට නීත්‍යානුකූලව කටයුතු කි[illegible]ට අපහසු වීම හා ඒ සඳහා මැනුම් කටයුතු කිරීමට මිනුම්දෝරුවන් හිඟ වීම.

### 4.1.5 කෘෂි අලෙවිකරණය ආශ්‍රිත ගැටළු

- වෙළෙඳපොළේ දී සිදුවන මිල උච්චාවචනය මත එළවළු නිෂ්පාදකයන් දැඩි අවදානම් තත්ත්වයකට පත්වීම.
- දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ ඉල්ලුමට වඩා අධික සැපයුමක් හේතුවෙන් එළවළු නාස්තිය වැඩිවීම.
- එළවළු වගාවේ දී අධික ලෙස රසායනික පොහොර හා කෘමිනාශක භාවිතා කිරීම හේතුවෙන් එළවළු කල් තබා ගැනීමට අපහසු වීම (එබැවින් එළවළු විශාල වශයෙන් වෙළඳපළට එන විට එය මිල කෙරෙහි බලපායි).
- පෞද්ගලික අංශය වී මිල පාලනයේ ඒකාධිකාරියක් පවත්වා ගෙන යාම නිසා අස්වනු නෙළන කාලයට වී මිල ඉතා පහළට වැටීම.
- සෑම ගොවියෙකුට ම වී ගබඩා කිරීමේ පහසුකම් නොමැති වීම.
- ගොවීන් විසින් වී වගා කරන කාලයේ දී වැයවන අධික වියදම සඳහා ලබාගත් ණයමුදල්, අස්වනු නෙළාගත් විගස ආපසු ගෙවීමට සිදුවන නිසා වී ගබඩා කරගැනීම ප්‍රායෝගික ව කළ හැකි කාර්යයක් නො වීම.
- දේශීය අර්තාපල් වෙළඳපලට එන සමයේ ම ආනයනික අර්තාපල් ද වෙළෙඳපොළට පැමිණෙන නිසා දේශීය අර්තාපල් ගොවීන් ආර්ථික වශයෙන් පීඩාකාරී තත්ත්වයකට පත්වීම.

## 4.2 ගොවීන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.2.1 ගොවි සංවිධාන හා ගොවිජන සහභාගිත්වය ආශ්‍රිත යෝජනා

- විවිධ ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි ගොවීන්ගේ අදහස් ද ලබාගෙන ගොවීන්/ගොවි සංවිධානවල තිරසාර පැවැත්ම සහතික වන සේ ගොවිජන සංවර්ධන පනත සංශෝධනයට ලක්කිරීම.
- වත්මන් ගොවිජන සංවර්ධන පනතේ කාරක නියෝග නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම. කමිටු රැස්වීම්වලට සහභාගී විය යුතු රාජ්‍ය නිලධාරීන්ගේ දායකත්වය අනිවාර්යයෙන් ලබා ගැනීමට හැකිවන සේ පනතට සංශෝධන ඇතුළත් කිරීම.
- ගොවි සංවිධානවලට නිලධාරීන්ට සාජුව කටයුතු කිරීමට බලතල ලැබෙන සේ පනත සංශෝධනයට ලක්කිරීම.
- ගොවි සංවිධානවලට ස්වාධීනව කටයුතු කිරීමට හැකි පරිදි සියළු ආකාරයේ රාජ්‍ය නිලධාරී/දේශපාලන බලපෑම්, ඇඟිලි ගැසීම් වැළැක්වීම.
- ගොවි සංවිධාන මඟින්, ගොවීන්ට ලැබෙන ප්‍රතිලාභ වැඩි කිරීමට පියවර ගැනීම.
- කෘෂිකර්මය හා කෘෂිකාර්මික අලෙවි ක්ෂේත්‍රය සම්බන්ධ අමාත්‍යවරුන් හා අමාත්‍යාංශ නිලධාරීන් සහභාගිත්වයෙන්, කෘෂිකාර්මික ක්ෂේත්‍රය මුහුණ දෙන ගැටළු සාකච්ඡා කිරීම සඳහා සම්මේලනයක් වාර්ෂිකව පැවැත්වීම.
- ගොවි සංවිධාන ශක්තිමත් කිරීම, නායකත්වය හා ගොවීන් සවිබල ගැන්වීම උදෙසා, පුහුණු වැඩසටහන් පැවැත්වීමට පියවර ගැනීම.

### 4.2.2 කෘෂි යෙදවුම් ආශ්‍රිත යෝජනා

- පෞද්ගලික සමාගම් මඟින් වෙළෙඳපොළට නිකුත් කරන බීජ සඳහා යම්කිසි ප්‍රමිතියක් ඇතිකිරීමට රජය මැදිහත් වීම.
- දේශීය බීජ රැක ගැනීම සඳහා රජයේ වැඩපිළිවෙළක් සැකසීම.
- බීජ වී නිෂ්පාදනය සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබාදීම.

- කාබනික පොහොර භාවිතයට ගොවීන් යොමු කරන වැඩපිළිවෙළ ක්‍රමවත් හා වේගවත් කිරීම සඳහා ගොවීන්ගේ දැනුම වර්ධනය කිරීම.
- කාබනික පොහොර සකස් කරන්නන් සඳහා අනුග්‍රහය ලබාදීම හා වෙළෙඳපොළ හඳුන්වා දීම.
- කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම සඳහා යම් යම් නීතිරීති ඇති කිරීම (සහනාධාර පොහොර දීමේ දී, කාබනික පොහොර යෙදීම අනිවාර්යය කිරීම).
- පළිබෝධනාශක හා කෘමිනාශක කෘත්‍රිම (අධික) මිලක් යොදාගෙන අලෙවි කිරීම නිසා ගොවීන් අපහසුතාවයට පත්වීම වැළැක්වීම සඳහා ලේබල් පාලනයක් සිදුකිරීම (දැනට ලේබල් කර ඇත්තේ කෘත්‍රිම මිලකි. එක් එක් වෙළෙඳුන්ට අවශ්‍ය ආකාරයට එහි මිල අඩුකර අලෙවි කරයි. නියම මිලක් නැත).

### 4.2.3 කෘෂි ණය ආශ්‍රිත යෝජනා

- රාජ්‍ය හා පෞද්ගලික බැංකුවලින් කෘෂි ණය ලබා ගැනීමේ දී දැනට පවතින අනවශ්‍ය බාධා ඉවත්කර ලිහිල් ක්‍රම ඇති කිරීම.
- ගොවිජන සංවර්ධන බැංකුවලින් ණය නිකුත් කිරීමේ දී සිදුවන අක්‍රමිකතාවයන් වැළැක්වීම සඳහා (තම හිතවතුන්ට ණය ලබාදීම වැනි) ක්‍රමවත් වැඩපිළිවෙළක් සැකසීම.
- ගොවි බැංකු ක්‍රමය ගොවියාට වඩාත් සමීප කිරීම.
- ගොවීන්ට ණය ලබාගත හැකි කෘෂි සමුපකාර සමිති බැංකු ක්‍රමයක් ඇරඹීම (දැනට අනුරාධපුර දිස්ත්‍රික්කයේ මෙවැන්නක් ක්‍රියාත්මකව පවතී. මෙය පහසු ක්‍රමයකි).
- කෘෂි ආම්පන්න සඳහා බැංකු ණය ලබා ගැනීමේ දී දැනට පවතින පොළිය අඩුකිරීම.

### 4.2.4 කෘෂි ව්‍යාප්තිය ආශ්‍රිත යෝජනා

- කෘෂිකර්ම උපදේශක සේවාව නිසි පරිදි ගොවීන්ට ලැබීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් සැකසීම හා ඒ සඳහා කෘෂි උපදේශක නිලධාරී හිගය අවම කිරීම.
- නිලධාරීන් සඳහා කෘෂිකාර්මික වැඩසටහන් සැලසුම් කිරීම හා කළමනාකරණය පිළිබඳ දැනුම හා ආකල්ප වර්ධනය කිරීම.
- කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේ යෙදිය හැකි කෘ.ප.නි. සහකාරවරුන්ට අවශ්‍ය තාක්ෂණ පුහුණුව ලබාදීම මගින් එම සේවය ගොවියාට ලබාදීම. ඒ සඳහා ඔවුන්ගේ සේවය ඇගයීම් වැඩපිළිවෙළක් ද ආරම්භ කිරීම.
- විවිධ රාජ්‍ය ආයතන ග්‍රාමීය මට්ටමේ ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් අතර අන්තර් සම්බන්ධතාවයන් පවත්වා ගෙන යාමට පියවර ගැනීම.
- කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන්ගේ කාර්යභාරය සහ සමාජ බලගැන්වීම පිළිබඳ පුහුණු වැඩසටහන් දියත් කිරීම.

### 4.2.5 වාරි ජල කළමනාකරණය ආශ්‍රිත යෝජනා

- වැව් තාවුලුවල, වැව් රක්ෂිතවල අනවසර ගොවීන් ඉවත් කිරීමට පියවර ගැනීම හා ඒ සඳහා දැඩි නීතිරීති පැනවීම.
- ඇළ වේළි නඩත්තුව සම්බන්ධව ගොවි සංවිධානවලට ඇති බලතල ක්‍රියාත්මක කිරීමට හැකිවන සේ බලය වැඩි කිරීම.
- තිරසාර ජල කළමනාකරණය පිළිබඳ ගොවීන් පුහුණු කිරීම.
- රජයේ වාරි ඉදිකිරීම්වල දී ගොවි සංවිධානවල අදහස් ලබා ගැනීමට පියවර ගැනීම.

- දැනට විශාල වශයෙන් ගොඩ වී ඇති සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කර ජල ධාරිතාව වැඩිකිරීමට පියවර ගැනීම.
- සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය, අක්‍රමිකතාවයෙන් තොරව කිරීම සඳහා වූ සියළු ආකාරයේ (දේශපාලන හා නිලධාරී) බලපෑම් අවම කිරීම සඳහා පියවර ගැනීම.
- වැව්වල රොන්මඩ ඉවත් කිරීම සඳහා පෞද්ගලික අංශයේ සහය ලබා ගැනීම.
- සෑම කුඩා වැවක් ආශ්‍රිතව මිරිදිය කර්මාන්තය ආරම්භ කිරීම (ඒ තුළින් වැව ද ආරක්ෂා වන අතර, ස්වයං රැකියා ද උත්පාදනය වේ).
- සියළු විශාල වැව් හා කුඩා වාරි පද්ධති එහි ජල ධාරිතාවය වැඩි වන සේ ප්‍රතිසංස්කරණයට භාජනය කිරීම හා වාරි ජලය ලැබීම තහවුරු කිරීම මගින් ගොවිතැන් කෙරෙහි ගොවියාගේ මෙන් ම නව පරපුරේ විශ්වාසය තහවුරු කිරීම.

### 4.2.6 කෘෂි අලෙවිකරණය ආශ්‍රිත යෝජනා

- වී සඳහා ස්ථාවර මිලක් ලබාදීම.
- ප්‍රාදේශීය වී ගබඩා පහසුකම් ඇති කිරීම.
- වී සඳහා වන අවම මිල කිලෝ 01 ක් සඳහා රු. 2/- කින් වැඩි කිරීම.
- ආර්ථික මධ්‍යස්ථානවල පවතින ආහාර බෝග මිල ගණන් (කිලෝ ග්‍රෑමයක් සඳහා) විද්‍යුත් තොරතුරු මාධ්‍ය මගින් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය තවදුරටත් පුළුල් කිරීම.
- හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයෙන් යෝජිත ආහාර වෙළෙඳපල මිල ගණන් තොරතුරු ලබාදීමේ S M S පණිවිඩ සේවාව සියළු ජංගම දුරකථන සේවා ඔස්සේ ලබා දීමට පියවර ගැනීම.
- බෝග විවිධාංගීකරණය සඳහා රජයේ නිලධාරීන් ගොවියාගේ සහායට මැදිහත් වීම (එමගින් අස්වනු නෙළන සමයේ දී සීඝ්‍රයෙන් සිදුවන මිල අඩුවීම වැළැක්විය හැක).
- දේශීය ගොවීන් රැකගැනීම සඳහා ක්‍රමවත් ජාතික ප්‍රතිපත්තීන් සැකසීම.
- අර්තාපල් වැනි ආහාර බෝග ආනයනය කිරීමේ දී දේශීය ගොවීන් ආරක්ෂා කරගත හැකි පරිදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.
- අලෙවිකරණය පිළිබඳ ව නිලධාරීන් සඳහා මෙන් ම ගොවීන් සඳහා ද සුදුසු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

ඇමුණුම i

## විශේෂ දේශනය

**නිදහසින් පසු ගොවි ආර්ථිකය – ආචාර්ය එල්.පී.රූපසේන - නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ), හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය**

ගොවි ආර්ථිකය යනු කුමක්ද ? ගොවි ආර්ථිකයේ ප්‍රගතිය, ගොවි ආර්ථිකය මුහුණ දී ඇති ප්‍රධාන අභියෝග හා එම අභියෝග ජය ගන්නේ කෙසේද? යන්න මෙහි දී අවධානයට ගැනිණි. 1970 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ වී, බඩ ඉරිඟු, කුරක්කන් කව්පි, මුංඇට, උඳු, අර්තාපල්, බතල, මඤ්ඤොක්කා, රතු ලූනු, ලොකු ලූනු, හා මිරිස්, ගස්ලබු, අන්නාසි, කෙසෙල් හා එළවළු යන විවිධ බෝගයන් සම්බන්ධව ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලැබූ දත්ත පදනම් කරගෙන මෙම ඉදිරිපත් කිරීම සිදු විය. එහි දී එම බෝග වගාවන් හි වපසරිය හා නිෂ්පාදනයේ වර්ධනය මෙන් ම අඩුවීම් පිළිබඳව ද දත්ත මගින් පැහැදිලි කෙරිණි. එපමණක් නොව, අදාළ වර්ෂයන්වල දී එම බෝගයන් හි ආනයන හා අපනයන ප්‍රමාණයන් පිළිබඳව ද තොරතුරු ඉදිරිපත් කරන ලදි. එසේ ම 1970 – 1980 දක්වා උතුර හා නැගෙනහිර පළාත් කෘෂිකර්මාන්තය සඳහා සිදුකළ දායකත්වය පිළිබඳ ව විශේෂයෙන් පෙන්වා දුනි.

මෙම දේශනයේ දී විශේෂයෙන් ම පහත සඳහන් කරුණු පිළිබඳ ව අවධානය යොමු විය.

1. **ශ්‍රී ලංකාවේ ගොවි ආර්ථිකයේ ලක්ෂණ**

- **හීනවන ආන්තික ඵලදායිතාවය**
  ගොවි ආර්ථිකය ඉඩම් පදනම් කරගනිමින් පවතින්නක් නිසා ශ්‍රමය, පොහොර, කෘමිනාශක වැනි යෙදවුම් භාවිතයන් සමග ආරම්භයේ දී නිෂ්පාදනය වඩා වැඩි වේගයකින් ද පසුව අඩු වේගයකින් ද, වර්ධනය වී, උපරිම වී, අඩු වී යයි.
- ස්වභාව ධර්මය මත තීරණය වීම ( වැස්ස සහ නියගයට මුහුණ දීමට සිදුවේ).
- කාලීන රටාවක් අනුව සිදුවීම (මහ සහ යල කන්නයට වගාව සිදුවීම).
- නිෂ්පාදන නරක්වන සුළු බව
- සැපයුමෙ හි අනම්‍යතාවය (අවශ්‍ය වේලාවට සැපයුම වැඩි කිරීමට නො හැකි වීම).
- ඉල්ලුම් අනම්‍යතාවය (සැපයුම වැඩි වුවත් ඉල්ලුම ඒ ආකාරයෙන් වැඩි නො වීම).
- ප්‍රතිලාභ ලබා ගැනීමට කල්පමා වීම (වගා කිරීමත්, අස්වනු ලැබීමත් අතර කාලයක් ගතවීම).
- බාහිර සාධක මත නිෂ්පාදන අවධානමක් ඇතිවීම (ගොවියාට පාලනය කිරීමට නො හැකි නියග, ලෙඩ රෝග වැනි සාධක).

2. **ගොවිපොළ කළමනාකරණය**

කෘෂිකර්මාන්තයේ දී කළමනාකරණය ඉතා වැදගත් විය යුතු බව අවධාරණය කෙරිණි. මෙහි දී ශ්‍රමය, ඉඩම්, ධනය, දැනුම හා ව්‍යවසායකත්වය කළමනාකරණය කළ යුතු වේ. ගොවියාගේ ප්‍රධාන ම අවශ්‍යතාවය “ගොවි පවුල” තෘප්තිමත් කිරීම හෙයින් ඔහු ඉහත සාධක සැලකිල්ලට ගනිමින් විද්‍යාත්මකව තම වගා ක්ෂේත්‍රය පිළිබඳ දිගුකාලීන හා කෙටිකාලීන තීරණ ගන්නකු විය යුතු බව මෙහි දී අවධාරණය කෙරිණි.

## 3. ශ්‍රී ලංකා ගොවි ආර්ථිකයේ ප්‍රධාන සංධිස්ථාන කිහිපයක්

### වී නිෂ්පාදනය

වාර්තාගත අන්දමින් 2008 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය මෙ.ටො. 3,875,000 දක්වා වැඩි වී ඇති අතර, සහනාධාරය මත පොහොර නිකුත් කිරීම නිසා උඩවලව ප්‍රදේශයේ කෙසෙල් ඉඩම් නැවත වී වගාව සඳහා යෙදවීම හා පුරන් කුඹුරු විශාල ප්‍රමාණයක් අස්වැද්දීමට හැකිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත. සාම්ප්‍රදායිකව නිෂ්පාදන සාධක ලෙස ශ්‍රමය, ඉඩම් සහ ධනය සැලකුවත් අද වන විට දැනුම හා ව්‍යවසායකත්වය ඊට එකතු කර ඇත. දැනුම තුළින් ශ්‍රමය, ඉඩම් සහ ධනය මනාව හසුරුවන අතර, ව්‍යවසායකත්වය තුළින් ලාභදායීව ව්‍යාපාර ගෙන යාමට අවශ්‍ය හැකියාව වර්ධනය කරයි.

### බඩ ඉරිඟු නිෂ්පාදනය

2008 වර්ෂයේ ලංකාවේ බඩ ඉරිඟු නිෂ්පාදනය මෙ.ටො.112,527 ක් ලෙස වාර්තාගත අන්දමින් ඉහළ ගොස් ඇත. දේශීය කුකුළු මස් පරිභෝජනය වැඩිවීමෙන් කුකුළු ආහාර සඳහා බඩඉරිඟු යොදා ගැනීම වැඩි වී ඇත. මේ නිසා බඩඉරිඟු සඳහා වැඩිවන ඉල්ලුමක් ඇත. මෙයින් පෙන්වා දෙන්නේ නිෂ්පාදන වේගයට වඩා හතර පස් ගුණයකින් බඩඉරිඟු අවශ්‍යතාවය ද වැඩි වී ඇති බව යි. මෙයින් පෙන්වා දෙන තවත් වැදගත් දෙයක් නම්, බඩඉරිඟු නිෂ්පාදනය තවදුරටත් වර්ධනය කිරීමේ හැකියාවක් පවතින බව යි.

### රතු ලූනු නිෂ්පාදනය

මේ වන විට දඹුල්ල වෙළෙඳපොළට යාපනයෙන් ද රතුළූණු විශාල වශයෙන් පැමිණෙන බැවින්, තොග මිලෙ හි අඩුවීමක් දක්නට ඇත. එසේ ම ගොවීන් විසින් අලුත් ඉඩම්වල ද රතු ලූනු වගා කරනු ලැබීම වෙළඳපොළට අධික සැපයුමක් ඇති කරනු ඇත. බෝග පුරෝකථනය වැදගත් වන්නේ මෙවැනි අවස්ථාවක දී ය.

අප සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයෙන් බැහැරයාමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇත. දේශීය කෘෂිකර්මය, කෘෂි ව්‍යාපාර බවටත්, ගොවියා, ගොවි ව්‍යාපාරිකයකු බවටත් පත්කරලීමේ කාර්යය ඇරඹිය යුතු සමය එළඹ ඇත. 2008 ලෝක බැංකුව සිය සංවර්ධන වාර්තාවේ දක්වා ඇත්තේ ද රටක් සංවර්ධනය කිරීමේ දී කෘෂිකර්මාන්තයට හිමිවන ප්‍රමුඛස්ථානය පිළිබඳව යි.

ඇමුණුම ii

## සහභාගී වූ ගොවි නියෝජිතවරු

1. කේ.ආරියසිරි මහතා - ආයතන සංවර්ධන නිලධාරි, කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය, අනුරාධපුරය.
2 සමන් ප්‍රේමරත්න මහතා - සංවර්ධන සහකාර, වාරිමාර්ග දෙපාර්තමේන්තු කාර්යාලය, වැල්ලවාය.
3. ඒ.වී.ඩී.ධර්මසිරි දයානන්ද මහතා - සුමිතුරු ගොවි සංවිධානය, 456, කළුඅග්ගල.
4. රෝහිත චන්ද්‍ර සෝමපාල මහතා - සභාපති, අනුරාධපුර දිස්ත්‍රික් ගොවිජන සේවා බල මණ්ඩලය, කහටගස්දිගිලිය.
5. ඒ.එම්.ඒ.බණ්ඩාර මහතා - සභාපති, දැලිවල කාෂිකර්ම කමිටුව, වැරැල්ලපන, රඹුක්කන.
6. ජී.ඩී.සමරකෝන් මහතා - සභාපති, බදුල්ල දිස්ත්‍රික් ගොවි සංවිධාන බල මණ්ඩල, ඌව පරණගම ගොවි සංවිධාන කාර්යාලය, ඌව පරණගම.
7. එච්.එස්.සුගතපාල රත්නපාල මහතා - සභාපති, ඇගල්ඔය ගොවිජන සේවා මධ්‍යස්ථානය, බුලත්සිංහල.
8. ආර්.එම්.ධර්මදාස මහතා - ලේකම්, ගෝඨාභය ගොවි සංවිධානය, බෝතලේ පහළගම, අඹේපුස්ස.
9. ආර්.ජී.රත්නසිරි රාජපක්ෂ මහතා - වීර පරාක්‍රම ගොවි සංවිධානය, 4 ඇළ, පොළොන්නරුව.
10. කරුණාදාස පල්ලියගේ මහතා - සභාපති, මාතර දිස්ත්‍රික් ගොවි සංවිධානය.
11. එච්.ඩී.අනුරුද්ධ හේරත් මහතා - අනුශාසක,අරුණ ගොවි සංවිධානය, මිරිහාන්පිටිය, නාගොල්ලාගම.
12 ඩබ්.එම්.සිරිසේන මයා - සභාපති, හැළඹ එක්සත් ගොවි සංවිධානය, බිබිල
13. ජයසිරි බණ්ඩාර මහතා - උප සභාපති, ව්‍යාපාර කමිටුව, මහවැලි "බී" කලාපය, දම්මින්න.
14. එච්.එම්.අයි.බී.හේරත් මහතා - සභාපති, ඒකාබද්ධ ගොවි සංවිධානය, හුරුළුපෝෂිත ඇළ, කලුන්දෑව, දඹුල්ල.
15. පතිරාජ විජේකෝන් මහතා - ලේකම්, කොට්ඨාස කළමනාකරණ කමිටුව, ගල්කිරියාගම.
16. පී.ඩී.කරුණාරත්න මහතා - සභාපති, මොරගහකන්ද ගොවි සම්මේලනය.
17. සරත් උපාලි මුණසිංහ මහතා - ලේකම්, "එච්" කලාප ව්‍යාපාර කමිටුව, තලාව.
18. සිරිසේන දිසානායක මහතා - උප සභාපති, ව්‍යාපාර කමිටුව, තලාව.
19. එච්.කේ.කරුණාදාස මහතා - සභාපති, උඩවලව ව්‍යාපාර ගොවි සම්මේලනය.
20. ඩී.පොඩි මහත්තයා මහතා - උප සභාපති, ව්‍යාපාර සම්බන්ධීකරණ කමිටුව "සී" කලාපය.
21. නිහාල් පෙරේරා මහතා - සභාපති, අරුණ බෙදුම් ඇළ ගොවි සංවිධානය, පදවි ශ්‍රී පුර, වැලිඔය.
22 ආර්.ඩබ්.එම්.ලලිත් මහතා - ලේකම්, කඳුරුගස්දමන ගොවි සංවිධානය, අනුරාධපුරය.
23. එස්.විමලසේන මහතා - ගැමුණු ගොවි සංවිධානය, මෙගොඩවැව, අනුරාධපුරය.
24. ඊ.ඒ.ඇඩ්මන් ජයවර්ධන මහතා - භාණ්ඩාගාරික, කොස්පොතු ඔය ගොවි සංවිධානය, පරගහමුල, හිඳගොල්ල.
25. එස්.පී.එම්.රූපසිංහ මහතා - ලේකම්, ව්‍යාපාර කමිටුව, කිනියම ගොවි සංවිධානය, වීරපොකුණ.
26. එච්.එම්.සී.කපිල ප්‍රියන්ත මහතා - සභාපති, දඹේවැව දකුණු ඇළ ගොවි සංවිධානය, වෙහෙරයාය, ඇතිලිවැව.
27. දි.මු.පුංචි බණ්ඩාර මහතා - සභාපති, බුත්තල අමුණ ගොවි සංවිධානය, බුත්තල.
28. කේ.ඒ.ප්‍රේමතිලක මහතා - සම සභාපති, සමගි ශ්‍රී පුර ගොවි සංවිධානය, පදවි ශ්‍රී පුර.
29. ඩී.පී.එම්.පුංචිබණ්ඩා මහතා - රුවන්වැලි ගොවි සංවිධානය, අංක 20, සමූහ ගොවිපොළ, පුබුදුපුර, අනුරාධපුරය.
30. ජී.ජී.ජයසේන මහතා - සභාපති, ගල්ඔය වම් ඉවුර ව්‍යාපාර ගොවි සංවිධානය, අම්පාර.
31. ඒ.ඩී.රංබණ්ඩා මහතා - ලේකම්, සොරබොර ඒකාබද්ධ ගොවි සම්මේලනය, මහියංගනය.
32. එස්.ආර්.ප්‍රේමදාස මහතා - භාණ්ඩාගාරික, ඒකාබද්ධ ගොවි සංවිධානය, ඉබ්බාගමුව.
33. නිහාල් වන්නිආරච්චි මහතා - සභාපති, රුහුණු ගොවි සංවිධානය, යාය 10, රාජාංගනය.
34. සිරිසේන රණවීර මහතා - සභාපති, ලුණුගම්වෙහෙර වම් ඉවුර ව්‍යාපාර උප කමිටුව, තිස්ස.

ඇමුණුම iii

## සම්පත් දායකත්වය – හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය

1. ආචාර්ය එල්.පී.රූපසේන මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)
2. ආචාර්ය ටී.ඒ.ධර්මරත්න මහතා - අංශ ප්‍රධාන (අලෙවි ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය)
3. ජේ.කේ.එම්.ඩී.චන්ද්‍රසිරි මහතා - අංශ ප්‍රධාන (කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය)
4. එම්.එම්.එම්.අහියර් මහතා - අංශ ප්‍රධාන (පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශය)
5. එන්.එස්.බී.ඇපාකන්ද මහතා - අංශ ප්‍රධාන (වැ.බ.)මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය
6. ආර්.එල්.එන්.ජයතිස්ස මහතා - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
7. එස්.එම්.ඒ.සමරකෝන් මහතා - පර්යේෂණ නිලධාරී
8. එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා - පර්යේෂණ නිලධාරී
9. ආචාර්ය ඩබ්.ඩී.වික්‍රමසිංහ මිය - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිණී
10. චිත්‍රා හතුරුසිංහ මිය - අධි පර්යේෂිකා
11. ගාමිණී කුසුම් කුමාර මිය - සහාය අධි පර්යේෂිකා
12. රේණුකා වීරක්කොඩි මිය - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිණී

### වැඩසටහනේ සම්බන්ධිකාරක

13. එන්.එස්.බී.ඇපාකන්ද මහතා - පර්යේෂණ නිලධාරී / අංශ ප්‍රධාන (වැ.බ.) මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය

### හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය වෙනුවෙන් සහභාගී වූ පර්යේෂණ නිලධාරී/සංඛ්‍යාන නිලධාරී/ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරීන්ගේ නාම ලේඛනය

14. එච්.එම්.ජේ.කේ.හේරත් මහතා - පර්යේෂණ නිලධාරී
15. ටී.පී.සෝමරත්න මහතා - පර්යේෂණ නිලධාරී
16. එස්.ඇපාසිංහ මහතා - පර්යේෂණ නිලධාරී
17. ඩබ්.එච්.ඩී.ප්‍රියදර්ශන මහතා - පර්යේෂණ නිලධාරී
18. එන්.පී.ජී.සමන්ත මහතා - පර්යේෂණ නිලධාරී
19. ඊ.ඒ.සී.ප්‍රියංකර මහතා - පර්යේෂණ නිලධාරී
20. ඩබ්.ඒ.එන්.විජේසූරිය මහතා - පර්යේෂණ නිලධාරී
21. ආර්.පී.විදානපතිරණ මිය - පර්යේෂණ නිලධාරිණී
22. ආර්.වයි.ඩී.එම්.ආර්.එන්.කේ.රඹුක්වැල්ල මිය - පර්යේෂණ නිලධාරිණී
23. පී.පී.එල්.සමරසිංහ මිය - පර්යේෂණ නිලධාරිණී
24. බී.ඒ.ඩී.එස්.බමුණුආරච්චි මිය - පර්යේෂණ නිලධාරිණී
25. ඉන්දිකා පතිරණ මෙය - පර්යේෂණ නිලධාරිණී
26. ඩබ්.එම්.ඒ.සී.එස්.විජේතුංග මෙය - පර්යේෂණ නිලධාරිණී
27. එම්.ටී.පද්මජානි මෙය - පර්යේෂණ නිලධාරිණී
28. සන්ධ්‍යා සේනානායක මිය - ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරිණී
29. එන්.එස්.ජේ.කේ.නිශ්ශංක මහතා - සංඛ්‍යාන නිලධාරී

**කළමනාකරණය/වාර්තාකරණය**

30. එන්.එස්.ඩබ්.නවරත්න මහතා - ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරි
31. රංජිත් දිසානායක මහතා - දෘශ්‍යාධාර කාර්මික ශිල්පී (ඡායාරූප)
32. වත්සලා ගමගේ මහත්මිය - ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිණී (වාර්තාකරණය)

23590

පුස්තකාලය
LIBRARY
ගො.ගො.හා.ප.පු.ආ
HARTI